**2021 මාර්තු මස 04 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 මාර්තු මස මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |

39. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය
40. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
41. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
42. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
44. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
45. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
46. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
47. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
48. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.03.04 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනීම හා සලකා බැලීම</u>

2021.02.05 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2021.02.05 දින සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග එන් අපොන්සු මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.02.05 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන -</u>

02(1) **<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

එක්සත් ජාතික පක්ෂය, පාලිත රංග බණ්ඩාර මහතා මහ ලේකම්, මොරටුව මහ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය සඳහා ඔබව පත් කරන බව සතුටින් දන්වමි කියලා පිලිප් ගාවින් මත්තෙස් මැතිතුමාට ලිපියක් එවලා තියෙනවා. ඒ ලිපියේ පිටපතක් සභාවට යොමු කරන්න කියලා තියෙනවා එය සභාගත කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එම ලිපිය සම්පූර්ණම සභාවට කියන්න පුලුවන්ද?

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

නාගරික මන්ත්‍රී පිලිප් ගාවින් මත්තෙස් මහතා අංක 12, ගාලුපාර, රාවතාවත්ත, මොරටුව. හිතවත් මහත්මයාණනි, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය මොරටුව මහනගර සභාව. මොරටුව මහ නගර සභාව එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය සඳහා ඔබව පත් කරන බව සතුටින් දන්වමි. ඒ අනුව මොරටුව මහ නගර සභා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ කටයුතු ශක්තිමත්ව ඉදිරියට මෙහෙය විම සඳහා ඔබ මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකගේ මඟපෙන්විම යටතේ කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර ඔබගේ ඉදිරි කටයුතු සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරමි. ස්තූතියි මෙයට හිතවත් පාලික රංග බණ්ඩාර මහ ලේකම් එක්සත් ජාතික පක්ෂය. පිටපත් - ගරු නායක තුමා ,නියෝජ්‍ය නායක තුමා, කොළඹ දිස්ත්‍රික් සභාපති තුමා, කොට්ඨාශ බල මණ්ඩල සභාපතිතුමා, ලේකම් මොරටුව මහ නගර සභාව සේනක දමයන්ත සිල්වා මහතා කාරුණික දැනගැනිම සඳහා යනුවෙන් ලිපියේ සඳහන් වෙනවා. ඇත්තම කියනවා නම් අපේ ප්‍රශ්ණයක් නොවෙයි නමුත් විශේෂයෙන්ම මට මතකයි මගේ අවධියේ සිටි කියන්නම් අපි විපක්ෂයෙන් ඉන්න කොට පක්ෂයෙන් එවකට හිටපු ලේකම් හෝ නගරාධිපතිට එවපු ලිපියකින් තමයි අනුෂ ගුණසේකර මහත්මයා විපක්ෂ නායක වෙන්නේ. ඉන් පසුව මගේ පාලන කාලය ආරම්භ කලාට පස්සේ පලවෙනි විපක්ෂ නායක විදියට ඔය වගේම ලිපියක් එව්වා ධම්මික චන්ද්‍රනාත් ප්‍රනාන්දු මහත්මයාට. ඊළඟ එක එව්වා 2011 දි එතුමා පරාජයට පත් විමත් සමඟම එව්වා අපේ විපක්ෂ නායක විදියට කටයුතු කරන්න කුලරත්න පිරිස් ගරු මන්ත්‍රීතුමාට, ඊට පසුව නාගරිම මන්ත්‍රී යූ.එල්. සේනක දමයන්ත සිල්වා මැතිතුමා එක්සත් ජාතික පක්ෂය කණ්ඩායම් ධුරය එවකට අකිල විරාජ් කාරියවසම් මැතිතුමා එවලා තියෙන්නේ. මේ අනුව තමයි කටයුතු වෙලා තියෙන්නේ. නාගරික මන්ත්‍රී යූ.එල්. සේනක ද සිල්වා මහතා අංක 64/1 විශ්ව විද්‍යාල මාවත, කටුබැද්ද මොරටුව. හිතවත් මහත්මයාණනි. එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය මොරටුව මහ නගර සභාව එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් ධුරය සඳහා ඔබව පත් කරන බව සතුටින් දන්වමි. ඒ අනුව මොරටුව මහ නගර සභා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ කටයුතු ශක්තිමත්ව ඉදිරියට මෙහෙය විම සඳහා ඔබ මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකගේ මඟපෙන්විම යටතේ කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර ඔබගේ ඉදිරි කටයුතු සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරමි. ස්තූතියි මෙයට හිතවත් නීතිඥ අකිල විරාජ් කාරියවසම් මහ ලේකම්. පිටපත් නායකතුමා, සභාපතිතුමා, කොළඹ දිස්ත්‍රික් සම්බන්ධිකරන කමිටු සභාපතිතුමා, කොට්ඨාශ බල මණ්ඩල සභාපතිතුමා, දිස්ත්‍රික් කළමනාකරන තුමා ලේකම්තුමා මොරටුව මහ නගර සභාව.

ගරු මහ නගරසභා මන්ත්‍රීවරුනි තවත් ලිපියක් ලැබී තියෙනවා.

ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු නගරාධිපති මොරටුව මහ නගර සභාව ගරු නගරාධිපතිතුමනි මොරටුව මහ නගර සභාවේ විපක්ෂ නායක ලෙස තව දුරටත් යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා කටයුතු කිරිම සම්බන්ධයෙනි. මොරටුව මහ නගර සභාව නියෝජනය කරන අත්සන් කර ඇති විශේෂ කණ්ඩායමේ මන්ත්‍රීවරුන් අපගේ ඒකමතික තීරණය වන්තේ තවදුරටත් අපි විපක්ෂ කණ්ඩායම් නායක ලෙස යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා කටයුතු කල යුතු බවකි. මහ නගර සභා විපක්ෂ නායක තනතුර සම්ප්‍රදායක තනතුරක් වන අතර සම්ප්‍රදායක එම තනතුර පත් කරනු ලබන්නේ විපක්ෂයේ යම් පක්ෂයක් විසින් එම පක්ෂ කණ්ඩායම් නායකයා වශයෙන් නම් කරනු ලබන පුද්ගලයකු නොව විපක්ෂ නායක පිලිගැනිමට විපක්ෂයේ බහුතර මන්ත්‍රී වරුන්ගේ කැමැත්ත ඇති පුද්ගලයා වේ. ඒ අනුව නාගරික මන්ත්‍රී යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

විපක්ෂ නායක වශයෙන් තවදුරටත් කටයුතු කලයුතු බව විපක්ෂයේ බහුතර මන්ත්‍රීවරුන්ගේ තිරණය වන හෙයින් ඒ මහතා තව දුරටත් මොරටුව මහ නගර සභාවේ විපක්ෂ නායක වශයෙන් පිලිගෙන කටයුතු කල යුතු යැයි දැනුම් දෙමු. ස්තුතියි මෙයට විශ්වාසී කියලා මහ නගර සභා මන්ත්‍රීවරු දස දෙනෙක් අත්සන් කරලා තියෙනවා. තිසර මෙන්ඩිස්,නිරෝෂන්අපොන්සු,ප්‍රසන්න මනෝජ්,ශ්‍රියානි හේමලතා,ක්‍රිෂනි ප්‍රනාන්දු, ලිහිණි ප්‍රනාන්දු, ශිරෝමි ඉන්දිකා කුරේ, සජිත් දුමින්ද පිරිස්, සුදර්ශනි ප්‍රියන්තිකා, සහ සුනිල් නන්දසිරි මාසකෝරාල. මේ අත්සන් ලිපිය බාරදිම කියවිම මගේ වගකීමක් වුනත් මම දන්නේ නැහැ මටත් සම්ප්‍රදාය ක්‍රියාත්මක කරන්න ගිය සභාවේ බැරි වුනා ඒ අවස්ථාවේ බරපතල විදියට හානි සිදුවුනා නීතිය ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා. මමත් දන්නවා විපක්ෂ නායක කියලා තනතුරක් නැහැ මමත් ඕක 2002 ගන්න ගිහිල්ලා මහින්ද මහත්මයා කතා කරලා ෆෝන් එකට කිව්වේ මල්ලි එහෙම එකක් නැහැ පාඩුවේ වැඩ කරගෙනයන්න කියලා. මම ඒක පිලිඅරගෙන නිකං හිටියා.මම එදා වැඩි මනා ප ගත්ත විපක්ෂයෙක් කෙනා විදියට. නමුත් ඒක සුදුසු කෙනාට දුන්නා. ඒක පක්ෂයෙන් නම් කරලා තිබුනා.පක්ෂයෙන් නම් කරපු කෙනා තමයි දිගටම ඇවිල්ලා තියෙන්නේ.ඒක මම දන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රශ්ණයක් පැන නැගිලා තියෙන අවස්ථාව විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕන පුද්ගලයෝ පිලිබඳ කිසිම ප්‍රශ්ණයක් නැහැ ඒ එක්කම තනතුරු පිලිබඳවත් ආසාවක් නැහැ. සංවිධායක ධූරයක් දරලා ඒකත් දිලා පස්වතාවක් බස්නාහිර පලාත් සභා ධූරය දරලා ඒකත් දිලා මෙතනට ආවේ. ඒක නිසා මම බලාපොරොත්තු වෙන්නේ තනතුර ගැන නොවෙයි මම පලාත් සභාවේ ඉන්න තැන මම හිතන්නේ නැහැ අද මෙතන ඉන්න කිසිම කෙනෙකටු කිට්ටු වෙන්න පුලුවන් වෙයි කියලා මම ඉන්නේ පලාත් සභාවේ අපේ පක්ෂයේ තුන්වෙනි තැන. විපක්ෂ නායක, විපක්ෂ සංවිධායක, සහ කණ්ඩායම් නායකයන් ගියාට පස්සේ ඇති වෙන පලවෙනි තැන ඉන්නේ මම. එතනට මේ සභාවේ ඉන්න කිසිම කෙනෙකුට මම හිතන්නේ නැහැ එතනට කිට්ටු වෙන්න පුලුවන් කියලා.මීට වඩා උත්තරිතර සභාවක්. මම මුලිකම දෙයක් දැක්කා අපි සම්ප්‍රදායකුලව එනකොට මම තුන්වෙනි පලාත් සභාවෙත් ඉදලා හතර වෙනි පලාත් සභාව එනකොට එනවා මංජු ශ්‍රී අරංගල නවක මන්ත්‍රීවරයෙක්.හැබැයි එතුමා විපක්ෂ නායක වුනාම එතුමට පලවෙනි පුටුව දෙන්න වුනා.ඒක තමයි සම්ප්‍රදාය. එතකොට මේ සභාවේදිත් විපක්ෂ නායක තනතුරක් ඇත්තටම නැහැ.විපක්ෂයෙන් කණ්ඩායම් නායක විදියට නම් කලායින් පසුව සියලු දෙනාගේම කැමැත්ත එතන තිබුනා. කිසිම කෙනෙක් විරුද්ධ වුනානම් අභියෝගයට ලක් කලා නම් මට ඒ පුටුව ලැබෙන්නෙත් නැහැ.මට ඒ තනතුර ලැබෙන්නෙත් නැහැ පක්ෂ ලේකම් ලියුම එව්වයි කියලා වැඩක් වෙන්නේ නැහැ මම දන්න විදියට.ඒ ඒතැන තිබුනේ නමුත් එදා අපි කණ්ඩායම ඒකමතිකව තීරණය කලා විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුජිත් මන්ත්‍රීතුමා නියෝජනය කලා ඒ අයගෙත් බහුතර කැමැත්ත තිබුන නිසා තමයි මට එතන වාඩි වෙන්නට තිබුනේ. නගරාධිපතිතුමනි මම කියන්නේ මේ තනතුර නීත්‍යානුකූල තනතුරක් නොවෙයි අපි මෙච්චර කල් අරගෙන ආවාට. ඕනම සභාවක විපක්ෂ නායක කියලා හඳුන්වාදීමක් කරන එක සම්ප්‍රදායකව කරන තනතුරක් විතරයි.ඒ නිසා මේ සම්ප්‍රදායක කියන තනතුරට බලපෑම් කරන්න කිසිම මහ ලේකම් කෙනෙකුට පක්ෂ නායකයෙකුට අයිතියක් නැහැ බලයකුත් නැහැ. මම පැහැදිලිවම කියනවා ඒ නිසා මහ ලේකම් වරයා මට දුන්න ලිපියත් බලයක් නැහැ.මම පැහැදිලිවම කියනවා මහලේකම්වරයා මට එවන ලිපියත් බලයක් නැහැ.බලයක් තියෙන්නේ නගරාධිපතිතුමනි මහජන ජන්දයෙන් තේරී පත්වුනු මහජන නියෝජිතයින් විදියට තේරී පත් වෙලා එන මේ සභාව උත්තරිතරයි. මේ සභාවේ ඔබතුමා නගරාධිපතිවරයා විදියට මහ ලේකම්

වරයා ලිපියක් එවනවා මෙතුමාව නගරාධිපති කරන්න කියලා ඒක පිලිගත්තේ නැත්නම් මේ සභාව ජන්දයකට අවතීර්ණ වුනා නම් බහුතරය කැමැත්ත ගන්න කියලා තමයි ඔය පුටුවේ වාඩිවෙන්නේ.තමුන්නාන්සේට ඒ ආශිර්වාදය තිබුනා තමුන්නාන්සේට ඒ තත්වය කිසි දෙයක් මතු වුනේ නැහැ. එදා මට ඒ තත්වය තිබුනා හැබැයි අභියෝගයකට ලක් කලා නම් ප්‍රශ්ණයකට බඳුන් වෙනවා.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ඒක මගේ පෞද්ගලික ප්‍රශ්ණයක් නොවෙයි.මට මෙතනින් අයින් වෙලා යන්න පුලුවන් කම තියෙනවා.ගෙදරට වෙලා හරි ඉන්න පුලුවන් කම තියෙනවා.ඒත් නගරාධිපතිතුමනි මෙකේ බහුතරයක් මන්ත්‍රිවරුන්ගේ කැමැත්තට ඉඩ දීමක් සිදු කල යුතුයි කියන තැන මම ඉන්නවා.විශේෂයෙන්ම අපි මේ හැම දේකටම කමිටු තිබුනත් ජන්දයක් විමසනවා. යම්කිසි තීරණයක් ගන්න වුනානම් ජන්දයක් විමසනවා. ඒ ජන්දය තමයි මේ සභාවට බලපැම ඇති කරන්නේ.ඒ නිසා නගරාධිපතිතුමනි මේකේ ජන්ද තුනක් තිබෙන පුද්ගලයෙක් ජන්ද දෙකක් තිබෙන පුද්ගලයෙක් මේ ස්ථානයට ඇවිත් ඉද ගත්තොත් එහෙම තාම අපි ඉන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් අපිව නෙරපලා නැහැ.අපිව නෙරපලා ඉවරවෙලා මේ තනතුර ඇති කලා නම් කිසිම තත්වයක මේ බලපැම් ඇති කරන්නේ නැහැ. ඒ සාමාජිකයින් අත්සන් කරලා ලිපියක් දීලා නැහැ මෙපමන ප්‍රමාණයක් අපිත් එක්ක ඉන්නවා කියලා. සමහර විට දෙන්නෙක් වෙන්න පුලුවන්. යම්කිසි විදියකින් ජනතා විමුක්ති පෙරමුනේ හතර දෙනෙක් ඉන්නවා මේ සභාවේ.ඒ අය ලිපියක් ඉදිරිපත් කලොත් එහෙම බහුතර කැමැත්ත අපිට තියෙන්නේ කියලා. තමුන්නාන්සේටඑතනදි ප්‍රශ්නයකට ගැටෙන්න ඉඩ තියෙනවා.අපිව වෙනම කොන් කරලා තියෙනවා නම්.ඒ නිසා නගරාධිපතිතුමනි මම කියන්නේ අද ඔබතුමා ගන්න තීන්දුව අනාගතයට බලපානවා.ඒ නිසා මේක සම්ප්‍රදායානුකූලව කියන්නේ අපි කාටවත් බැදීමක් නැහැ.මහ ලේකම් වරයට බලපැමක් නැහැ තමුන්නාන්සේ මේ උත්තරිතර සභාව එතනට ගෙනියන්න එපා.ඔය පුටුවේ තව කෙනෙක් වාඩි වෙයි.තමුන්නාන්සේ හැමදාම ඉන්නේ නැහැ. එක්සක් ජාතික පක්ෂයෙන් කෙනෙක් පුලුවන්.එතකොට ඒ අය තමුන්නාසේව හැල්ලුවට ලක් කරන්න ගනිවි.තමුන්නාන්සේගේ පාලනය විපක්ෂයෙන් පාලනය සම්පූර්ණයෙන්ම ආදිපත්‍යයට ගන්න දීලා තියෙනවා.ඒ නිසා මම දකිනවා හැල්ලුවට ලක් වෙනවා කියලා.නගරාධිපතිතුමනි පැහැදලිවම කියනවා මේ සභාවේ ගරුත්වයකුත් තියෙන්නට ඕන.හැම දෙයක්ම ඒකපාර්ශික වෙන්න හොඳ නැහැ. මම දන්නවා තමුන්නාන්සේ මාත් එක්ක අමනාම වෙන එකක් නැහැ.ලබැදියාවක් මෙතන තියෙනවා. ලබැදියාවට ඉඩ දීම තුල භායානක තත්වයක් නිර්මානය වෙන්නත් පුලුවන්.විපක්ෂ නායක තුමාගේ ආශිර්වාදයත් අපි අරගෙන තියෙනවා. මට වඩා ඒ ආශිර්වාදය තමුන්නාන්සේ අරගෙන තියෙනවා.මම දැක්කා තමුන්නාන්සේ නගරාධිපතිධූරයට පත් වෙනකොට මෙතනින් ගමන් කරනකොට මෙතුමට වැඳලා ගියා ඒක වරදක් නොවෙයි. එතුමට ගරු කිරිමක් තියෙනවා. අපෙත් ගරු කිරිමක් තියෙනවා. තව මාස ගණනකින් අපිව අයින් කරන්න පුලුවන් ජන්දයකට යන්න පුලුවන්. යම් කිසි දවසක අපි එකතු විමට ඉඩ තියෙන අවස්ථාවක් තියෙනවා.ඒ නිසා නගරාධිපතිතුමනි මේ තියෙන තත්වයෙන් එතනට යන්න එපා විපක්ෂයේ මන්ත්‍රිවරුන්ට ඒ අවස්ථාව ලබලා දෙන්න විපක්ෂයේ කණ්ඩායම් නායකයා විදියට තෝරා ගන්න ඒක කරගෙන යන්න. හැම දෙයක්ම ඔබතුමා කියන දේ හොඳයි කියන තත්වයට ගන්නත් එපා මේ සභාව නියෝජනය කරන කොට සාධාරණ දේවල් කලේ.තමුන්නානසේගේ වරදක් දැක්කා නම් අපි පෙන්නලා දුන්නා. කලින් මුදල් කමිටුවට විරුද්ධව ජන්දය දෙනකොට ඒ සම්ප්‍රදාය අපි නැවැත්තුවා. හරි දේ හරි විදියට කලා. ඒ නිසාම අපි ඉල්ලිමක් කරනවා ගරු නගරාධිපතිතුමනි මහ ලේකම්ගේ ලියුමක් පිලිගන්න කොතනකවත් මේ නගර සභා ආඥා පනතේ කොතනකවත් නැහැ මහ ලේකම්වරයෙකුගේ ලිපියකට පත් කිරිමක් කරන්න කියලා විපක්ෂයේ කණ්ඩායම් නායක තෝරන්න කියලා ඇවිල්ලා නැහැ. එතන හිඩසක් තියෙනවා. අපි

එතනට යන්න ඕන නැහැ ඒ නිසා සභාවේ විපක්ෂයේ නියෝජනය කරන බහුතර මන්ත්‍රිවරුන්ගේ කැමැත්තට ඉඩ දෙන්න කියන ඒ ඉල්ලිම මම තමුන්නාන්සේගෙන් ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු සේනක දමයන්ත විපක්ෂ නායක තුමනි, මේක ලබැදියාවකට කරන එකක් නොවෙයි. ලබැදියාවකට කරනවා නම් අනිවාර්යෙයන්ම මම එදා ජන්ද විමසීමක් කරනවනේ පෙබරවාරි මාසේ 10 වනිදින අවුරුද්දයි මාස 18 කට පස්සේ ජන්දයක් තියපු වෙලාවෙදි අපි 23 විපක්ෂයෙ 25 යි ජන්දය තියන්න මහන්සි වෙච්ච ප්‍රමාණයට වඩා අතිශා මහන්සි විමක් සහ අතිශය මානසික ආතතියක් ඇතිකරගෙන තමයි ඔබතුමා කොහොම හරි නගරාධිපති වෙන්න අවසාන දවස දක්වා දරපු වෙහෙස මහන්සිය අපි නොදන්නවා නොවෙයි.එහෙම නම් මට තිබුනනේ ඔබ තුමා අද කියන දේ කරන්න. එදා ඔබතුමා කියන දේ මට කරන්න තිබුනනේ විපක්ෂනායක පත් කිරිම සඳහා මන්ත්‍රිවරුන්ගේ එකඟතාවයෙන් යෝජනාවක් කරන්න තිබුනනේ.එහෙම එකක් මගේ නැහැ. අවසාන තත්පරය දක්වා මෙතනට එනකනුත් මම දන්නේ නැහැ මේ අවසාන බජට් එක වෙලාවෙත් නැවත වතාවක් යම් යම් විදියට අපේ මන්ත්‍රිවරුන්ගේ මොකක් හෝ පුංචි කුමන්ත්‍රණයක් නිසා නැවත වතාවක් ඔබතුමා කල්පනා කලා පරද්දන්න පුලුවන් කියලා. ඒ වෙලාවෙත් යම් කිසි උත්සහයක් ගත්තා අපේ පක්ෂෙ කිව්වම පක්ෂය කිව්වේ බජට් එකක් දිනාගන්න බැරිනම් නගරාධිපතිධුරයක් දරන්න බැහැ කරුණාකරලා මේක එහෙම එකක් නොවෙයි.මේක සම්ප්‍රදායික විදියටත් මේ පත්වෙලාම තියෙන්නෙත් ජන්දෙකින් නොවෙයි ජන්දයකින් විමසන්නත් බැහැ ජන්දයකින් විපක්ෂනායකයෙක් පත් කරන්නත් බැහැ ඔබතුමාව පත් කරලා තියෙන්නෙත් ඔබතුමාගේ පක්ෂ නායකත්වයෙන් තමයි. මට තියෙන ප්‍රශ්ණය ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ නම් ලේකම් තුමා මේ එවලා තියෙනනේ. අපේ පක්ෂයෙන් ලේකම් එවලා නැහැනේ.ඔබතුමාව පත් කරලා තියෙන්නෙත් ඒ ලේකම්. එම නිසා ඒක වැරදිද ඒක හරිද ඔබතුමන්ලා තීන්දු කරන්න.ඒක මට කරන්න බැහැ. මොන විදියකින් වත් අහන්නත් බැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මට මතක විදියට මේ සභාව නියෝජනය කලා එක්තරා අවස්ථාවක ධම්මික චන්ද්‍රනාත් මහත්මයා විපක්ෂ නායක විදියට. ඒ අවස්ථාවේදි බහුතර මන්ත්‍රිවයෙක් ජන්දය දුන්නා කුලරත්න මහත්මයට එදා පිලිගත්තා කුලරත්න මහත්මයා විපක්ෂ නායක විදියට. මේ සභාවේ අතීතයක් තියෙනවා එදා ධම්මික මහත්මයාව අයින් කරලා කුලරත්න මෙතන වාඩි වුනා.කුලරත්න මහත්මයා මේ පුටුවේ හිටියා නමුත් කුලරත්න මහත්මයා මේ ජන්දයෙන් තේරි පත් වුනේ නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු සේනක දමයන්ත විපක්ෂ නායක තුමනි,ඔබතුමා වරද්දගෙන තියෙන්නේ. මම කියන්නම් මට ලොකු අවබෝධයක් තියෙනවා මේවා පිලිබඳව. විපක්ෂ නායක විදියට ඉන්න ධම්මික චන්ද්‍රනාත් මහත්මයට පලවෙනි පුටුව දෙන්න කිව්වම ඒක විතරයි විපක්ෂනායක කිව්වම මේ වරද්ද ගන්න එපා මට හොඳට මතකය තියෙනවා. අවශ්‍ය නම් වාර්තා ගේන්න.එදා කිව්වේ විපක්ෂ නායක වන ධම්මික චන්ද්‍රනාත් මහත්මයාට මුල් පිටුව දෙන්න කිව්වම ඒකට සභාව එකඟවුනා ඇරෙන්න

විපක්ෂනායක ධූරයට ඡන්දයක් විමසුවේ නැහැ.බොරු කියන්න එපා.සභාවේ වාර්තා බොරු කරන්න හදන්නත් එපා.ඔබතුමා නොදන්න දේවල් කියන්නත් එපා.

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා මතක් කිරීමක් කරන්වන අවශ්‍යයි.ඔබතුමාගේ වාරයෙන් පසු 2002 න් පසු 1997 විපක්ෂ නායක බවට පත්වෙන්නේ මගේ පියා තොමසන් ජේ මෙන්ඩිස් දිවංගත හිටපු සභාපතිතුමා ඊට පසුව එතුමා විපක්ෂනායක බවට පත් වෙනවා. ඒ අවස්ථාවේදි පලාත් සභා අපේක්ෂත්වය ලැබීම නිසා එතුමා අසුනෙන් නික්ම යනකොට සුදුසුකම තිබුනේ ධම්මික චන්ද්‍රනාත් මැතිතුමාට. නමුත් කුලරත්න පිරිස් මැතිතුමාව ඒ ස්ථානයේ අසුන්ගත කරලා තමයි මගේ පියා එතනින් යන්න ගියේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා ,සමාවෙන්න ඔබතුමා ඔය වැරදි කථානේ කියන්නේ.විපක්ෂ නායක නොවෙයි එතකොට ඔබතුමන්ලා පක්ෂයනේ.1979 න් පස්සේ 1997 තමයි අපි දිනන්නේ එතකන් ඔබතුමන්ලාගේ පාලන කාලයක් තියෙන්නේ. වැරදිනේ ඔබතුමා කියන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, 1997 තමයි විපක්ෂ කණ්ඩායම බවට පත්වෙන්නේ. එතකොට ධම්මික චන්ද්‍රනාත් මැතිතුමාට තිබුනේ නැහැ විපක්ෂ මන්ත්‍රිවරුන්ගේ බහුතර කැමැත්ත. එම නිසා කුලරත්න පිරිස් මැතිතුමාව අසුන්ගත කරලා මගේ පියා සභාවෙන් නික්ම යනවා. එතකොට කුලරත්න පිරිස් මැතිතුමාව සියලු මන්ත්‍රිවරුන් කැමැත්ත ප්‍රකාශ කරලා විපක්ෂනායක ධූරයේ ඉදිරි කටයුතු කරගෙන යන්න.එහෙම අවස්ථාවක් ඇතිවුනා මේ සභාව තුල 2002 න් පස්සේ ඔබතුමා කියපු ඔය සම්ප්‍රදාය ඒ විදියට තිබුනා. නමුත් අපි මතක් කරන්න ඕන සම්ප්‍රදාය තිබුන හැම අවස්ථාවකම බෙදීමක් තිබුනේ නැහැ. විපක්ෂයේ බෙදීමක් තිබුනේ නැහැ. අපේ පක්ෂයේ ලේකම් තුමා පත් කරන්නේ අපිත් එක්ක සාකච්ඡා කරලා බහුතර මන්ත්‍රිවරුන්ගේ කැමැත්ත අනුව මේ සියලු දෙනාගේම අශිර්වාදය තියෙන පුද්ගලයව තමයි එතනට පත් කලේ. ඒක අනුව තමයි ඔබතුමා ඒක පිලිඅරගෙන සභාගත කරලා ඉදිරියට සභාව අරගෙන ගියේ. මේ අවස්ථාවේ බෙදීමක් තියෙනවා ගරු නගරාධිපතිතුමා විපක්ෂයේ මන්ත්‍රිවරු බහුතරයකගේ කැමැත්ත තියෙන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා , බෙදීමක් කොහොමවත් දෙන්න බැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපේ කැමැත්ත අනුව මෙතන විපක්ෂ නායක කණ්ඩායම් නායකවරු ඉන්න බැහැ.ඒක සාමාන්‍ය දෙයක්.අපි කොහොමද ඒ සහයෝගය ලබා දෙන්නේ.අපිට ලබා දෙන්න පුලුවන් අපි එකඟතාවයක් තියෙන සේනක දමයන්ත සිල්වා මැතිතුමාට පමණයි. එහෙම නම් මෙතන මුලාසනය හැටියට ඔබතුමන්ලාගේ ප්‍රශ්ණයක් නොවෙයි විපක්ෂයේ ප්‍රශ්ණයක්

විපක්ෂයෙන් බෙදීමක් තියෙනවා මෙතනද බහුතරයකගේ කැමැත්තට ඉඩ දෙන්න කියන ආයාචනය පමණයි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

(මේ අවස්ථාවේදි නියෝජ්‍ය නගරාධිපති මුලසුන හොබවන ලදි.)

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමා,මට මතුකරන්න තිබෙන කාරණාව තමයි මේක අපේ ප්‍රශ්ණයක් නොවෙයි විපක්ෂයේ ප්‍රශ්ණයක් තිසර මන්ත්‍රීතුමා ඉතිහාසය මතක් කරපු කාරණක් තියෙනවා මමත් ඒ සභාවේ 97 හිටියා. තොමසන් මැතිතුමා පලාත් සභා වට ඇතුල් වෙනවාත් සමඟම ඔය සිදුවිම වුනා.තිසර මන්ත්‍රීතුමා කිව්වා වගේ ඉතිහාසයේ පලවෙනි වතාවට විපක්ෂයේ බෙදීමක් ඇතිවුනා අපි මේ කථා කරන්නේ ආඥා පනතේ ලබා දිපු තනතුරක් සම්බන්ධයෙන් නොවෙයි. විපක්ෂ නායක කියන්නේ සාම්ප්‍රදායික රීතියක් සම්බන්ධයෙන් අපි මේසභාව ඇතුලේ කථා කරද්දි පරිස්සම් වෙන්න ඕන හේතුව මේ සාම්ප්‍රදායි රීතිය අපිට නීතියක් කර ගන්න බැහැ. අපිට අයිතියකුත් නැහැ ඒක කරන්නත් බැහැ.මීට කලින් මෙහෙම ප්‍රශ්ණයක් මතු වෙලා නැති නිසා මේ සම්බන්ධයෙන් ආඥා පනතක අතුරු ව්‍යවස්ථාවේ සඳහනක් නැහැ.මගේ තර්කය තමයි මේ විපක්ෂ කණ්ඩායම ජනතා විමුක්ති පෙරමුණ නැතිව අනිකුත් සියලුම මන්ත්‍රිවරු 2018 මැතිවරණයේදි තරඟ කරපු පක්ෂය මොකක්ද මේ නෝනලා/මහත්වරු. සියල්ල තරඟ කලේ එක්සත් ජාතික පක්ෂයෙන් මේ මන්ත්‍රිවරු සියලු දෙනා නියෝජනය කරන්නේ මේ කථා කරන පැයේ පවා නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂය එතුමන්ලාගේ බෙදීම අපිට අදාල නැහැ. නමුත් පක්ෂයක් විදියට තාම ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ.පක්ෂයක මහ ලේකම් කියන්නේ පක්ෂයේ සියලු තින්දු තීරණ ගන්න පක්ෂයක් විදියට වගකීම් ගන්න පුද්ගලයා. හැබැයි සේනක දමයන්ත ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු විදියට එතුමා හිතනවා නම් ලේකම්ට බලයක් නැහැ තියෙන්නේ සභාවට කියලා ඒ සම්බන්ධයෙනුත් විවාද තියෙනවා.නගරාධිපතිතුමාට කිසිම දොසක් නැහැ. එතුමා ලේකම් එවපු ලිපියත් ,විපක්ෂයේ මන්ත්‍රිවරු 10 ක් අත්සන් කරලා දිපු ලිපියත් එතුමා ඉදිරිපත් කලා.මෙතනදි මේ සම්බන්ධයෙන් ගරු වැඩ බලන නගරාධිපතිතුමනි අපිට අදාල ප්‍රශ්ණයක් නොවෙයි. විපක්ෂයට බේර ගන්න අවස්ථාව දීල තියෙන එක තමයි මගේ අදහස.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමා,අපේ නොවන ප්‍රශ්ණයක් අපේ බවට පත් වෙලා තියෙන වෙලාවක මේ ප්‍රශ්ණය පිලිබඳව යම් අදහසක් පල කරන්න ඕන. මේ ප්‍රශ්ණයට නගරාධිපතිතුමා ප්‍රමුඛ මේ සභාවට උත්තර නැහැ. උත්තරය තියෙන්නේ අදාල පාර්ශවයේ අපිට එවල තියෙන ලියුමට අනුව ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාත්, මෙතෙක් විපක්ෂ නායක ලෙස කටයුතු කරපු සේනක දමයන්ත මන්ත්‍රීතුමා ප්‍රමුඛ කණ්ඩායම විසින් විසඳ ගත යුතු ප්‍රශ්ණයක්. දේශපාලනයේ විවිධ හැල හැප්පුම් තියෙනවා අපිට අත්දැකිම් තියෙනවා. නමුත් අපි කවුරුත් පිලිගන්නවා විපක්ෂ නායක කියන්නේ නාමික තනතුරක් අප ජනතා විමුක්ති පෙරමුණ විදියට එම නෛයිතික නොවන තනතුර පිළි නොගත්තත් සම්ප්‍රදායට අනුව පවතිනවා මේ ධුරය.අපිට අනුව නම් විපක්ෂ නායක කියන්නේ ජනතාව තුල අරගල කරන කෙනා. නමුත් සම්ප්‍රදායට අනුව පවතින්නේ මේ ආකාරයට නිසා මම ඉතා ඕනැ කමින් ඉල්ලා සිටිනවා අද සභාවේ මහජනතාවගේ ගැටලු සාකච්ඡා කරන්න තියෙන අවස්ථාව මේ තෙරුම්ගත යුත්තේ නගරාධිපතිවරයාටවත් , සභාවටවත් සේනක දමයන්ත මන්ත්‍රීතුමාගෙවත්, ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමගේ වත් හිත රිදවිමක් කරන්න

අවශ්‍ය නැහැ මොකද මේ සභාවට බැහැ.මේ සභාවට නියත ලෙසම නෛතිය නොවන ධුරයක පත් කිරිම පිලිබදව තින්දු තිරණ ගන්න බැහැ. ඒ ගැනිමට යාමම කුමන හෝ පාර්ශ්වයකට වැරදි ලෙස හිත රිදවිමක් සහ අසාධාරණයක් සිදු වෙනවා. එනිසා ඔබ පාර්ශ්ව දෙක සාකච්ජා කරලා එකඟ වෙන්න පුලුවන් කුමන කුමන දේශපාලන මත ගැටුම් තිබුනත් මන්ත්‍රිවරු විදියට මේ සභාවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමේදි ඉදිරියට බාදාවක් නොවන පරිදි අපි කොහොමද මේ ගැටලුව බේර ගන්නේ කියලා මේ සභාවට විසඳුමක් දුන්නානම් මම හිතනවා හොඳයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමා, අපි සභාවෙත් සඳහන් කරපු කාරනාත් එක්ක නව මැතිවරණ පණතත් එක්ක කොටඨාශ ක්‍රමයට බිහිවෙද්දි නියෝජ්‍ය නගරාධිපතිවරයා පත් කර ගන්නේ සභාවේ ජන්දෙන් ඒ අනුව තමයි ඔබතුමාවත් තේරි පත්වුනේ. මහ ලේකම් වරයට තියෙනව බලතල පෙර තිබුන මැතිවරණ ක්‍රමයට ආවානම් ඒක බලාත්මකයි. අනිත් එක තමයි ගරු වැඩ බලන නගරාධිපතිතුමා, අපේ මේ ප්‍රශ්ණය සම්බන්ධව වෙනත් පක්ෂයක් විදියට අපි ගිවිසුම් ගත වෙනවා.පක්ෂයේ සාමාජිකයෝ අත්සන් කරලා ඔවුන්ගේ සාමාජික ගාස්තු දැනටමත් ඔවුන් ගෙවනවා. ඊලඟ කාරණව තමයි මම ඇරෙන්න. මේක අධිකරණයේ පවතින ගැටුමක් ඒවගේම සමඟි ජනබලවේගය හෝ වෙන පක්ෂයක් බිහිවෙනවා නම් එකේ කෘත්‍යාධිකාරි මණ්ඩලයත් එක්ක තිබෙන ප්‍රශ්ණත් එක්ක අධිකරණයට ගිය ප්‍රශ්ණයක්.සභා මට්ටමෙන් හෝ පක්ෂ මට්ටමෙන් ගිය කාරණයක්. එනිසා අධිකරණයෙන් තින්දුවක් හෝ නියෝගයක් මේ තාක් දුරට ඇවිල්ලා නැහැ.එනිසා වර්තමන මහලේකම් වරයා එවන ලියුම අධිකරණ නියෝග වලට එකඟද නීත්‍යානුකුලද කියන ප්‍රශ්ණය තියෙනවා.

- සභා ඝෝෂා -

<u>මහ නගර සභා මන්ත්‍රී - ලිහිණි මේරියන් ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමා, එක්සත් ජාතික පක්ෂයෙන් ලේකම් විසින් මේ සභාවට ලිපියක් එවලා තියෙනවා.එතුමා සම්ප්‍රදායුනුකුලව පක්ෂය ගත්ත තින්දුවක් දැනුම් දිලා තියෙනවා.එම ලිපියෙන් මේ සභාව බැදිමකට ලක් වෙන්නේ නැහැ. දෙවන කරුණ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක සහ මොරටුව මහ නගර සභාවේ විපක්ෂ නායක කියන්නේ එකිනෙකට ස්වාධිනවු තනතුරු දෙකක්. මේක සම්ප්‍රදායික එකක් නොවෙයි. කණ්ඩායම් ඇතුලේ බෙදිමක් තියෙනව අවස්ථාවකදි එක්සත් ජාතික පක්ෂයේ ලේකම් විසින් කණ්ඩායම් ඒ තින්දුවෙන් එකඟවීමට අපිට බැරි කමක් නැහැ. ඒ නිසා මෙතන බහුතර කණ්ඩායමක් වන අපි අත්සන් කරලා ලිපියක් දිලා තියෙනවා බහුතර අපේ කැමැත්ත් අත්සන් කරලා. මෙතන විපක්ෂ ඇතුලේ තිබෙන බෙදිමක්. බෙදිමෙන් වැඩි වාසිය තියෙන්නේ මොකක්ද කියලා අපි සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. මම මේ අවස්ථාවේදි කියන්න කැමතියි සම්ප්‍රදායිකව එවපු ලිපිය සහ මේ තනතුරු දෙක ස්වාධින තනතුතරු දෙකක් නිසා බෙදිමක් තියෙනකොට වැඩි කැමැත්ත තියෙන්නේ කාටද අන්න ඒ වැඩි කැමැත්ත තියෙන පුද්ගලයා තමයි අපේ විශ්වාසය දිනාගෙන තියෙන තැනැත්තා විපක්ෂ නායක තනතුරේ පිහිටවිය යුතුයි. පක්ෂ නායක ලිපියකින් දැනුම් දුන්නට ඒ ලිපියෙන් මේ සභාව බැදෙන්නේ නැහැ. මේ ලිපියේ තීන්දුවට එකඟවෙන්න අපි බැදෙන්නේ නැහැ.

(මේ අවස්ථාවේදි නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා මුලසුන අසුන් ගන්නා ලදි.)

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, ඕක ඇත්තටම සිත්ති මසීනා බක්කර් මන්ත්‍රිතුමිය කිව්වානම් ප්‍රශ්ණයක් නැහැ. ඔබතුමිය මේ බෙදීමක් ඉල්ලන්නේ කොතනින්ද කියන එක මට තේරෙන්නේ නැහැ.බෙදීමක් ඉල්ලන්න පුලුවන් දේවල් තියෙනවා බැරි දේවල් තියෙනව.ඔබතුමිය මේකේ ඉන්න සියලුම දෙනාට වඩා නීතිය දන්න කෙනා විදියට ඔය බෙදීම ඔබතුමිය ඉල්ලන එකයි වරද.ගරු මන්ත්‍රතුමිය සේනක දමයන්ත මන්ත්‍රිතුමා රවිනාත් ජේ ගුණසේකර මන්ත්‍රිතුමා පිලිප් ගාවින් මත්තෙස් මන්ත්‍රිතුමා තිසර මෙන්ඩිස් මන්ත්‍රිතුමා අනුරසිරි මන්ත්‍රිතුමා ඊට අමතරව රාජකාරුනා මන්ත්‍රිතුමිය ඒ ඇරුනම ඔබතුමියලගේ පත්වීම් බලධාරියා වන එක්සත් ජාතික පක්ෂ ලේකම්ව ඔබ පිලිගන්නවද? නැද්ද? ඔබතුමියලා පක්ෂයෙ ලේකම්ගේ ලිපිය පිලිගන්නේ නැතුනම් ඒ පිලිගැනිම තුල මට දැන වෙලා තියෙන්නේ මම නම් කරගෙන තියෙන්නේ මේ පක්ෂයේ කවදාවත් 2002 සිට මොන මොහොතකවත් විපක්ෂ නායකයෙක් පත් කිරිම සම්බන්ධයෙන් විපක්ෂයට ප්‍රශ්ණයක් තිබුනේ නැහැ. ඒ අදාල වෙන්නාවූ දෙවන බහුතරය තිබෙන්නාවූ අය විපක්ෂයට යනවා ඒ එක්කම සෙසු පක්ෂත් එනවා ඒ අනුව පක්ෂයෙන් පක්ෂ නායකත්වයෙන් එවන කෙනා තමයි විපක්ෂ නායක ලෙස පිලිගත්තේ. ඒක රවිනාත් ජේ ගුණසේක මැතිතුමාටත් එසේමයි, මටත් ඒක එසේමයි ඒ අනුව පක්ෂ ලේකම් විදියට එවන විපක්ෂ නායක සේනක දමයන්ත ගරු මැතිතුමාව පිලිගත්තා. දැන් එවලා තියෙනවා එතුමාව නැතුව පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රිතුමාව පිලිගන්න කියලා. මම ජන්දයක් බෙදීමක් කොහේවත් නැහැ කොහොමවත් කරන්න දෙන්නත් බැහැ අපි සම්ප්‍රදායක් විදියටත් සම්ප්‍රදාය ක්‍රියාත්මක කරලා තියෙනනේ මෙන්න මේ වගේ ලිපි වලටම පමණයි. ලිපි වලට නැතුව කියන්නන් වලේ කියන එකකට සම්ප්‍රදායයන් ක්‍රියාත්මක කරලා නැහැ. ඔබතුමාලා/තුමියලා මේක අපි පිලිගන්නේ නැහැ. පිලිගන්න නැති වෙන්න ඕන තනතුර ගැන නොවෙයි.මේ ලිපිය පිලිගන්නේ නැහැයි කියලා කියන්න ඕන. අපිට අවශ්‍ය වන්නේ මේ ලිපිය පිලිගන්නවද? නැද්ද? වැරදි නීති නීතිඥ වරියක් විදියට දෙන්න එපා.

<u>මහ නගර සභා මන්ත්‍රි - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ලේකම් තමයි මහින්ද අමරවීර එතුමා කියලා තියෙනවා සුජිත් පුෂ්පකුමාර මහතාත් අපි පිලිගත්තා.පැරදුණ මන්ත්‍රිවරුනේ මේ එවලා තියෙන්නේ නම් කරලා. ඒවගේම තමයි එක්සත් ජාතික පක්ෂයේ ලේකම්තුමා පරාජය වූ මන්ත්‍රිවරුන්ව පත් කරලා තිබුනා. අපි ඒක පිලිගත්තා. දැන් මේක ආණ්ඩු පක්ෂයේ ප්‍රශ්ණයක් නොවෙයි.

<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අභිණවයෙන් පත්වෙන ජොෂ්ඨ මන්ත්‍රි ගාවින් මත්තෙස් මැතිතුමාව මම ප්‍රථමයෙන්ම සුභ පතන්න ඕන මෙතුමා අපේ පක්ෂය වෙනුවෙන් විශාල කැපවීමක් කරපු මොරටුව ආසනය තුල කැපවිමක් කරපු ජොෂ්ඨ මන්ත්‍රිවරයෙක් විදියට ප්‍රථමයෙන් සුභ පතනවා. ගරු නගරාධිපතිතුමනි මගේ කථාව අපි එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමක් විදියට මොරටුව මහ නගර සභාවට අපි පත්වෙනවා.ඊට කලින් ගරු නගරාධිපතිතුමා නාම යෝජනා ලබා දෙනකොට එක්සත් ජාතික පක්ෂයට අපි අයදුම්පතක් ඉදිරිපතක් අයදුම් කරනවා සිරිකොත මූලස්ථානයට මේ සියලු දෙනාම අපේක්ෂත්වය ලබා ගන්න ඒ අයදුම්පත ලබා දෙන්න ඕන. නගරාධිපතිතුමනි අපිට නොමිනේෂන් ලබා දෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් සහ ඒ අදාල ආසනයේ සංවිධායක

තුමා එහෙම කරලා නාගරික මන්ත්‍රීවරයෙක් ජනතාවගේ ජන්දෙන් හෝ ලැයිතුවෙන් පත් කරනවා නම් අනුපාත ක්‍රමයට හෝ සභාවට පත්වෙන්නේ. එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු විදියට ගිහිල්ලා නායකයන් ඉදිරියේ අපි දිවුරුමක් ලබා දෙනවා. පක්ෂයේ විනය අනුව ඉදිරියට කටයුතු කරනවා විනය අභිබවා ගියොත් ඕනෑම වෙලාවක පක්ෂ මහ ලේකම්ට බලයක් තියෙනවා ඉවත් කරන්න. ඒ අනුව අපි එදා ඔබතුමත් සමග තරඟ වැදුනා අපි එතකොට සේනක දමයන්ත මැතිතුමා තමයි නගරාධිපති විදියට නම් කලේ. එක්සත් ජාතික පක්ෂයෙන් ලියුම මත තමයි මෙතුමා පත් වෙන්නේ කණ්ඩායම් නායක විදියට. ගාවින් මන්ත්‍රීතුමා මේ 10 දෙනාගෙන් සමන්විත අත්සන් නොවෙයි තියෙන්නේ එදා බහුතරයක් තිබුන මෙතුමට 16 දෙනෙක්ගේ. එහෙම නම් එතුමා තමයි කණ්ඩායම් නායකයා වෙන්න ඕන එදා. අද මේ 10 දෙනෙක් මොකක්ද මේ විහිලුවක්. මේ සභාවට අගෞරවයක් කරන්නේ ගරු නගරාධිපතිතුමනි. ඒක මෙතුමන්ලා බලනවා මේ තනතුරු වලින් එක වරක් කිවුවා මට පලාත් සභාවේන් නැති වුනත් ඒ වගේ ගැටලු තිබෙනවා. තිසර මන්ත්‍රීතුමා කියනවා එතුමාගේ පියාගේ කාලෙදි විපක්ෂයේ ඉන්නකොට ධම්මික චන්ද්‍රනාත් මැතිතුමාට බහුතරය තිබුනේ නැහැ සභාවේ. සභාවේ බහුතරය තිබුනේ නැති නිසා එතුමා එවකට හිටපු නගරාධිපතිවරයා තොමසන් ජේ මෙන්ඩිස් මැතිතුමා පත් කරන්න කියල ලියුමක් ලබාදුන්නා. එතකොට ධම්මික චන්ද්‍රනාත් මැතිතුමා පමණයි විරුද්ධව කටයුතු කලේ. එවකට හිටපු ගරු අමාත්‍ය ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමා සංවිධායක වරයා විදියට ගියා පක්ෂ මහ ලේකම් ගාමිණි අතුකොරාල මැතිතුමා හමුවෙලා ලියුමක් ගෙනාවා නගරාධිපතිතුමාට භාර දුන්නා බහුතරය හිටියට වැඩක් නැහැ පත්විම කලේ ධම්මික චන්ද්‍රනාත් මැතිතුමාව. එක්කෙනයි හිටියේ එක්සත් ජාතික පක්ෂයෙන්. බහුතරය ලියුම දුන්නට වැඩක් නැහැ. අන්න ඒ විදියට තමයි ඒ කාලේ මෙතුමාට ඒ ගරුත්වය දුන්නා. ඒකට අපිත් අත්සන් කලා කණ්ඩායමක් විදියට යන්න ඕන නිසා. නමුත් දැන් පක්ෂ මහ ලේකම් මේ තනතුර පත්කරලා තියෙන්නේ.ඒක අභිබවා කාටවත් යන්න බැහැ ගරු නගරාධිපතිතුමනි. එහෙම නම් මේගොල්ලේ වෙන පක්ෂයක නම් ඒ පාර අපේ බෙදීම ඇති වුනා එක්සත් ජාතික පක්ෂයේ කැඩීමක් ඇති වුනා. ඒ කාලේ අපි මේකේ නීත්‍යානුකූල තත්වය අපි ගත්තේ නැහැ. පක්ෂ දෙක්ක තියෙනවා එදා බජට් දවසේ නායකතුමා අපිට කිව්වා නිහඩ වෙන්න කියලා. එහෙම නම් එදාගත්තු තින්දුවට මේගොල්ලේ එකඟවෙන්න එපැයි. එම නිසා මේ පත්විම නීත්‍යානුකූලයි. ඒක තමයි නිවැරදි පත්විම කියන එක මේ සභාවට මම ප්‍රකාශ කරනවා. ප්‍රශ්ණයක් තියෙනවා නම් මේගොල්ලන්ට යන්න පුලුවන් මන්ත්‍රීධූරය දිලා. එන්න ඉන්නවා එක්සත් ජාතික පක්ෂයේ ලැයිස්තුවේ මන්ත්‍රීවරු කණ්ඩායමක් ඉන්නවා පිටිපස්සේ එන්න බලාගෙන.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දීර්ඝව කථා කරනකොට මෙතන දේශපාලන කතා මතුවෙන්නේ. පක්ෂය අතර විසඳගන්න තියෙන ප්‍රශ්ණයක් මේක.අපි ඉල්ලිම කලේ මහ ලේකම්තුමාගේ ලිපියට මේ සභාව නැති තනතුරක් ඇයි අපි ආරූඪ කරගන්න යන්නේ. මහලේකම්තුමා එවුවොත් ලිපියක් මේ මන්ත්‍රීවරයා අස් කරලා මේ මන්ත්‍රීවරයා පිලිගන්න කියලා ඔබතුමා ඒක පිලිගන්නේ නැහැනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමාගේ කථාවට මම එකඟවෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරයෙක්ව අයින් කිරිමේ සම්පූර්ණ බලය නව පනතේ තියෙන්නේ ඒ පක්ෂයෙන් මහ ලේකම්ට පමණයි.හෙට ඔබතුමාව එව්වොත් ගරු සේනක දමයන්ත සිල්වා මැතිතුමාව පක්ෂයෙන් අයින් කලා ආසනය

පනවන්න එපා කියලා මට පුලුවන් ආසනය පනවන්නේ නැතිව ඉන්න.ඊට පස්සේ ඔබතුමා අධිකරණයට ගිහිල්ලා ඔබතුමාගේ නිවැරදි භාවය ඔප්පු කරමින් ඔබතුමා රිට් එකක් අරගෙන එනතුරු ඔබතුමාට ආසනය පනවන්න මට බැහැ.පක්ෂයේ මහ ලේකම්ට ඒ බලය පවරලා තියෙනවා ගිය එකෙනුත් මෙකෙන් ඒක සක්‍රීය කරලා ලේකම්ට පුලුවන් මැතිවරණ කොමසාරිස්ට පුලුවන් මැතිවරණ කොමසාරිස් ඉන්නේ දෙන නම ගහන කෙනෙක් මැතිවරණය තියන කෙනෙක් විතරයි. මන්ත්‍රිධුර සම්බන්ධයෙන් කටයුතු කරන්නට මැතිවරණ කොමසාරිස්ට කිසිදු බලයක් නැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම අද උදේ මැතිවරණ කාර්යාලයට කථා කරලා නිවැරදි භාවට තහවුරු කර ගත්තා. ඒක වැරදියි. මෙතන නැති තනතුර තමුන්නාන්සේ මහ ලේකම්තුමාගේ ලිපිය පිලිගන්නවාද? මේ ආඥාපනත් වල කොතනකවත් සඳහනක් නැහැ මහ ලේකම්වරයාගේ ලිපියක් පිලිගන්නට ඕන කියලා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ආඥා පනත කටයුතු කරනකොට මන්ත්‍රි ධූරයක් ලැබුනට පස්සේ ඒ මන්ත්‍රිධූරයත් එක්කමනේ සභාවක් වෙන්නේ. එතකොට මන්ත්‍රිධූරය සම්බන්ධයෙන් කටයුතු කිරිම තමයි ආඥා පනතට අනුව කරන්න ඕන. මන්ත්‍රිධූරය සහ ඒ ධූරධාරිත්වය සම්බන්ධයෙන් කටයුතු කිරිමට සභාවට හැකියාවක් නැත. සභාවට පුලුවන් වෙන්නේ මන්ත්‍රිධූරයක් පිලිගත්තට පස්සේ ආඥා පනත අනුව ඔහු තනතුරේ කටයුතු කිරිම පමණයි. ඒ ඇරෙන්න මන්ත්‍රිධූර ඇති කිරිම නැති කිරිම තනතුර ඇති කිරිම නැති කිරිම බලය තියෙන්නේ දැන් මාව මෙතන 50% ක් ගත්තා නම් ජන්දයක් විමසීමක් නැහැ. පක්ෂයේ නම් කරන සමන්ලාල් හෝ චේවා සමන්ත සිල්වා හෝ චේවා සුරංග අපොන්සු හෝ චේවා නම් කරන දෙන්නා තමයි නගරාධිපති , උප නගරාධිපති ඒක පක්ෂ මහ ලේකම්ගේ අයිතිය. ඒක ගැසට් කිරිම පමණයි මැතිවරණ කොමසාරිස් කරන්නේ. උදාහරණයක් කියමු ඔබතුමා ජන්දෙන් පත්වුනා ලිහිණි මන්ත්‍රිතුමිය නැතුව වෙන කෙනෙක්ව පත් වුනානම් මහ ලේකම් මිසක් මැතිවරණ කොමසාරිස් නොවෙයි.

**<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පැහැදිලිවම මෙතන කලින් ඔබතුමා කිව්වා වගේ නම් කරලා එවන එක හරි මෙතන බෙදිමක් අපි අතර තියෙනවා එම නිසා බෙදීමේදි අපි ඉල්ලිම කරන්නේ බහුතර මන්ත්‍රිවරුන්ගේ අවස්ථාව දෙන්න. ඒකට යම්කිසි විනයානුකුල තිරණයක් ගන්න ඕන මහ ලේකම් වරයා.

**<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේක බෙදිමක් නොවෙයි මහ ලේකම්තුමාගේ ලියුම අරගෙන එන්න කියලා කියන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,පක්ෂ මන්ත්‍රීධුර සම්බන්ධව පක්ෂ මහ ලේකම් වරයා තිරණයක් අරගෙන නැහැ අපිට විරුද්ධව විනයානුකුල තීරණයක් අරගෙන නැහැ තාම. දැනටත් සල්ලි කැපිලා යන්නේ තාමත් සිරිකොතට. කවුරු අභියෝගයට ලක් කලත් පක්ෂ සාමාජිකත්වය අපි තාම බැදිලා ඉන්නේ.අපි වරදක් කරලා තියෙනවානම් නිත්‍යානුකුල අයින් කිරිමක් කරන්න ඕන.කිසි ප්‍රශ්ණයක් නැහැ. එතකම් සභාවේ බහුතරයට අවස්ථාව ලබා දෙන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා ඇත්තටම කතා කරලා කිව්වා පලාත් සභාවේ විපක්ෂ නායකට ඒ පුටුව යන්න ඕන කියලා.පාර්ලිමේන්තුවෙත් එහෙම තියෙනවා. පලාත් පාලන ආයතන වල එහෙම තනතුරක් නැහැ තනතුරු වලට පුටු වෙන් කරන්නේ නැහැ. ඒ නිසා තමයි ධම්මික චන්ද්‍රනාත් ඔබතුමා ඉන්න පුටුවෙම ඉදලා විපක්ෂ නායක හිටියා කුලරත්න පිරිස් මහතා ජොෂ්ඨත්වය මත අද ඉන්නවා වගේම පිලිප් ගාවින් මත්තෙස් මන්ත්‍රිතුමා ඉන්නවා වගේම හිටියා ඔබතුමා නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා ඉන්න තැන හිටියත් පක්ෂයෙන් ඔබව නම් නම් කරලා තියෙන්නේ විපක්ෂ නායක ලෙස ඔබතුමාට එතන ඉදලා විපක්ෂ නායක ධුරය කරන්න පුලුවන්. අපි මෙතෙක් කල් නොකරපු දෙයක් මට කරන්න බැහැ.මට බෙදිමක් කොහොමවත් දෙන්නත් බැහැ. බෙදිමක් දෙන්න පුලුවන් එකකුත් නොවෙයි මම තුන්වෙනි පාරටත් පිලිඅරගෙන තියෙන්නේ පක්ෂ නායකත්වයෙන් එවන ලිපිය විතරයි. විපක්ෂයේ රවිනාත් ගුණසේකර මැතිතුමා ඉන්න පුටුවෙම ඉදලා මම මොන වෙලාවකවත් විපක්ෂ නායක ධුරයට අතක් උස්සලා නැහැ. පක්ෂ නායකත්වයෙන් එවපු එක කරන්නේ.මට මේ වෙලාවේ බෙදිමක් දෙන්න බැහැ. බෙදිමක් දෙන්න ගියාම කියයි අන්න සම්ප්‍රදාය විනාශ කරනවා කියලා. එතකොට සම්ප්‍රදාය විනාශ වෙනනේ නැහැ. පක්ෂ නායකත්වය ගත්ත තීන්දුව ක්‍රියාත්මක කරන සම්ප්‍රදාය විනාශයි. එතකොට ඒක මට කියනවා සම්ප්‍රදාය විනාශ කරන්න. අනිත් පැත්තෙන් කියනවා සම්ප්‍රදාය නැති කරලා නීතියට කටයුතු කරන්න ගියාම ඔන්න සම්ප්‍රදාය කඩනවා කියලා. මේක කබරගොයා තලගොයා කර ගන්නවා වගේ මුලසුනටම දෝෂාරෝපණය කරනවා. ගිය සතියේ මැරෙන්න ගියා සම්ප්‍රදාය කඩනවා කියලා. මේ සතියේ කියනවා ඒ සම්ප්‍රදායත් කඩනවා කියලා. මම දන්නේ නැහැ මොකක්ද කියලා මේ. මට තේරෙන්නේ නැහැ මුලසුනට බනින්න හරයක් එක්ක. හරයක් නැතිව බනින්න එන්න එපා. හරයක් නැතිව මුලසුනට අභියෝග කරන්න එන්නත් එපා.ගිය සතියේ සම්ප්‍රදාය ඕනයි කිව්වා.මේ සතියේ කියනවා මෙතෙක් කල් පක්ෂ ලේකම් දිපු සම්ප්‍රදාය නවත්වන්න කියලා. මට එහෙම කරන්න බැහැ. රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා මේක පිලිගන්න ඕන. මට එහෙම කරන්න බැහැ. මොකක් හරි ක්‍රමවේදයක් තියෙන්න ඕන. මේක අපේ ප්‍රශ්ණයක් නොවෙයි මම දන්නවා. මෙතන විපක්ෂ නායකතුමා කවුරු හිටියත් කරන්න පුලුවන් දේ ඔබතුමාම කරන දේ පමණයි මෙතුමටත් කරන්න පුලුවන්. මම කාරුණික ඉල්ලිමක් කරනවා මම ආසයි සේනක දමයන්ත මැතිතුමා ඊලඟ මැතිවරණය වෙන කම් සභාවේ ඉන්න ඕන.මම කැමතිය ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රිතුමියත් ඊලඟ මැතිවරණය වෙන කම් සභාවේ ඉන්න ඕන. මේකට බෙදිම් ඉල්ලන්න යන්න එපා.පක්ෂ ලේකම්වරුන්ව අභියෝගයන්ට ලක් කරන්න යන්න එපා. එහෙම ලක් කරන්න ගිහිල්ලා නැති දේවල් ඉල්ලන්න යන්න එපා. ඒක ඔබතුමන්ලගේ විනය පරික්ෂණය කින් තොරව වෙන්නාවූ විනය පරික්ෂණයට සාක්ෂියක් කරගන්න යන්න එපා.මේක හැන්සාඩ් වෙනවා.මේ බෙදිම ඉල්ලන්න එපා. මේක ඔබතුමන්ලා එලියට ගිහිල්ලා කථා කරලා බේරා ගන්න.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ ප්‍රශ්ණය අපට අදාල එකක් නොවෙයි.නමුත් නැති අර්බුදයක් එක්සත් ජාතික පක්ෂයෙන් නායකයන් විසින් ඇති කරලා අපිට තමුන්නාන්සේට මේ අයට ප්‍රශ්ණයක් ඇති කරලා තියෙන්නේ.අපි දැන් මේ වෙලාවේ මම විශ්වාස කරනවා ගරු නගරාධිපතිතුමා ඔබ තුමාකිව්වා වගේ විපක්ෂ නායක තුමා කියන්නේ හිටපු පලාත් සභා ජොෂ්ඨ මන්ත්‍රිවරයෙක්. පලාත් සභා මැතිවරණය නොබෝ දිනකින් එනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ඒ ප්‍රශ්ණය ඉන් අනතුරුව විසඳගන්න පුලුවන්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා, අපිට කියන්ව පුලුවන්ද මෙතුමා පත් වෙයිද නැත්ද කියලා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මගේ මතයක් මම ප්‍රකාශ කරන්නේ. අපේ සහෝදර මන්ත්‍රිවරු නිසා. මේ හැමෝම සභාව නියෝජනය කරන මන්ත්‍රිවරු නිසා.විපක්ෂයේ මන්ත්‍රිවරු වශයෙන් මම ඉල්ලීමක් කරන්නේ. පුලුවන් නම් ඔබතුමා විනාඩි 10 කට සභාව කල් තබලා ඒ අයට අවස්ථාවක් දෙන්න එක්සත් ජාතික පක්ෂ නායකයා විසින් ඇති කරපු අර්බුදය අපි මොරටුව වශයෙන් ඒ අය විසඳගත්තා කියන එක හොඳයි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා,මම කිව්වේ ඒක තමයි. ඇත්තටතම මේ සියලුම ගරු මන්ත්‍රිවරු මේ සභාවේ ඉන්නවා දකින්නයි මම කැමති. ගරු ලිහිණි මන්ත්‍රිතුමිය මේ උපදෙස දෙනකොට ඔබතුමිය හරියටම දෙන්න අපි සියලුම දෙනා මේ නීතිය දන්න නිසා.කරුණාකරලා ඔය අත්දැකීම මම විඳලා තියෙනවා මේ පුටුවේ ඉඳලා දෙවතාවක්. එක වතාවක් ගෙදර යන්න ඊලඟ වතාවේ මෙතනට එන්න. තනතුරක ඉඳලා ඒ තනතුරට අභියෝග කරලා ඒකට විනාශ වෙන්න යනකොට ඒක සම්බන්ධයෙන් ගන්නා ලද තීන්දු වලදී හොඳට බැට කාපු කෙනෙක් මම ඒ නිසා කැමති නැහැ ඔබතුමාලට ලැබිච්ච මන්ත්‍රිධුරය අයින් වෙනවට මම කැමති නැහැ. ඒ නිසා හරි තීන්දුව දෙන්න. පක්ෂ ලේකම්ව අභියෝගයට ලක් කරන්න එපා මේ වෙලාවේ. නැත්නම් මේක පිලිගන්න වෙනවා. අවාසනාවකට විපක්ෂයට අනුෂ ගුණසේකර වගේ නීතිඥයෙක් ඔබට නැහැ ඒකයි වෙලා තියෙන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නාගරික ලේකම් සභා ලේකම් නමටයි ලියුම මහ ලේකම් තුමා එවලා තිබුනේ.ඒ නිසා සභා ලේකම් තුමා සභාවට මේ තීරණය ඉදිරිපත් කලේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රි කණ්ඩායමේ විමසීමකින් තොරවයි මේ දැනුම්දීම කලේ. ඒ නිසා සභා ලේකම්තුමා සමඟ අපිට සාකච්ජාවක් අවශ්‍ය වෙනවා.ඒ නිසා අද අපි මේ සභාවෙන් නික්ම යනවා සභා ලේකම් තුමා සමඟ සාකච්ජා කරලා ඊලඟ සභාවේදි ගන්න තිරණය අපි ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

**මහ නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජේ.ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, තීන්දුව මොකක්ද කියලා ප්‍රකාශයක් කරන්න පුලුවන්ද?

(මේ අවස්ථාවේදි මහ නගර සභා මන්ත්‍රී යු.එල්.සේනක දමයන්ත ද සිල්වා, එම්. තිසර රසාංජන මෙන්ඩිස්,එම්.ලිහිනි ප්‍රනාන්දු, බී.සජිත් දුමින්ද පීරිස්, ජී.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු, ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු,එම්.සුදර්ශනි ප්‍රියන්තිකා ප්‍රනාන්දු ,එම්.ශිරෝමි ඉන්දිකා කුරේ, ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු සහ ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු යන මහත්ම/මහත්මීන් සභා ගැබෙන් පිටව ගියහ.)

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා,තීන්දුව මම නගරාධිපතිවරයා විදියට මේ පනතේ තියෙන්නාවූ බලතල අනුව හෙට දිනයේදි උපනගරාධිපතිවරයාට මේ සභාවේ මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වෙන්න උවමනා නම් අනිවාර්්යයෙන්ම මට ලියුමක් නොදි ඉල්ලා අස්වෙන්න බැහැ.ඒ වගේම ඔබතුමාට ඉල්ලා අස්වෙන්න ඕනයි කියලා මට ලියුමක් දුන්නම ඒ ලියුම මම පිලිගන්නේ නැති වුනාම පක්ෂ ලේකම්ට ඔබව අයින් කරන්නත් බැහැ. නගරාධිපති පිලිගැනිමට ලක් කරන් ඕන පක්ෂ ලේකම්ට අයිතිය තියෙන්නේ ඔබ විනය විරෝධි දෙයක් කරලා තියෙනවා නම් ඒකට විනය පරික්ෂණයක් තියල විනය පරික්ෂණයෙන් නෙරපුව ට පස්සේ තමයි පක්ෂ ලේකම්ගේ මට අහන්න පුලුවන් වෙන්නේ මේ පනතෙන්. සක්‍රීයව තියෙනවා ඕනැම වෙලාවක මට ඉල්ලා අස් වෙන්න ඕන නම් මම දෙන්න ඕන පලාත් පාලාන කොමසාරිස්ට. ඒ ඇරෙන්න සියලුම ගරු මන්ත්‍රීවරු දෙන්න ඕන නගරාධිපතිට. ඒ වගේම හෙට රංග බණ්ඩාර හෝ පක්ෂ ලේකම් විදියට ටිල්වින් සිල්වා මැතිතුමා හෝ පක්ෂ ලේකම් විදියට අපේ දයාසිරි ජයසේකර මැතිතුමා හෝ ලියුමක් එවුවොත් සුජිත් පුෂ්ප කුමාර , එහෙම නැත්නම් නිශාන්ත ප්‍රදිනාන්දු එහෙම නැත්නම් ගාවින් මත්තෙස් යන අයව අයින් කරලා තියෙනවා දෙන්න එපා කියලා මම නවත්වනවා. මට මැතිවරණ කොමසාරිස්ගෙන් ලිපියක් එන්න ඕන නැහැ. මැතිවරණ කොමසාරිස් කරන්නේ ඒ ලේකම් වරයාගේ තීරණය නීත්‍යානුකුල ලියවිල්ලක් බවට පත් කරලා මන්ත්ධුරය වෙන කෙනෙක්ව නම් කිරිම.ඒ අතරතුරේදි අධිකරණයට ගිහිල්ලා ඒකට වලක්වාලිමේ නියෝගය ක් ගන්නට පුලුවන්. ඒක ගත්තේ නැත්නම් මම අනිවාර්්යයෙන්ම පිලිගන්නේ පක්ෂ මහ ලේකම් එවන නම පමණයි ඒක පනතේ මට තියෙන අයිතියක්. ඒක අභියෝගයට ලක් කරන්න කාටවත් බැහැ. එහෙම තියෙන කාලෙක තමයි මේ සේනක දමයන්ත මහත්මයාවත් විපක්ෂ නායක ලෙස පත් කරලා තියෙන්නේ. මට ඊට වඩා දෙයක් කරන්න අයිතියක් නැහැ. සේනක දමයන්ත සිල්වා මැතිතුමට ඉන් පස්සේ වෙන්නේ ඔහුට හිමි ජොෂ්ඨත්වයට මත තියෙන ආසනයට යන්න පමණයි.

**මහ නගර සභා මන්ත්‍රී - යු.අනුරසිරි ජේ.ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි,එතකොට එහෙම නම් අපිට සඳහන් වෙන විදියට ගරු නගරාධිපතිතුමාගේ ප්‍රකාශනය අනුව අපිට පිලිගන්න වෙනවා විපක්ෂ නායක විදියට ගාවින් මත්තෙස් මැතිතුමාව අද දිනයේ සිට.

**මහ නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම නිහඬව බලාගෙන හිටියා ඔබතුමා කොයිතරම් කරුණු පැහැදිලි කරාද කියලා. ඒවගේම මේ මන්ත්‍රීවරුත් මට හිතවමත් අයත්, පක්ෂ අයත්, මධ්‍යස්ත අයත් කථා කලා මගේ හදවතින්ම ගරු නගරාධිපතිතුමා ප්‍රධාන මේ සියලුම මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පුද කරනවා ප්‍රථමයෙන්ම. තව එකක් මම කියනවා ලබන මාසේ අපි එනවා මහ ලේකම්තුමාගෙන් ලිපියක් අරගෙන දැන් මේ අය ගියා නේද පලාත් යන්න බැහැ මේගොල්ලන්ට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරු වෙන්න ඉන්න අයගේ වරප්‍රසාද කොල්ල කාලා සභාව ඇතුලේ ඉන්නේ. අද එනවා නගරාධිපතිතුමනි මේ සභාවත් නොමඟ යවලා නගරාධිපතිතුමා ප්‍රධාන මේ සියලුම නිලධාරින්ව නොමඟ යවලා මට දෙන්න විපක්ෂ නායක කම මම දෙන්නම් ඔබතුමාටත් කියන මතය ඇතිව තමයි ඇවිල්ලා ඔය කැහැ ගහන්නේ. වැඩ කරන්නේ සමඟි බලවේගයට නමුත් එක්සත් ජාතික පක්ෂය කියලා කියන්නේ. එක්සත් ජාතික පක්ෂය විකුණ විකුණ සමඟි බල වේගයට තමයි කත් අදින්නේ. මේ ඔක්කොමලාව මහ ලේකම් ගැන දන්වා. මේගොල්ලන්ගේ හඩපටි, මේගොල්ලන්ගේ ජයාරූප මේගොල්ලො ගමින්ගමට ශබ්ද විකාශන යන්ත්‍ර දමලා මැතිවරණ වෙලාවේදි පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ චරිත ඝාතනය කරපු හැටි. සියලුම එක්සත් ජාතික පක්ෂ නායකයන්ගේ චරිත ඝාතනය කරපු හැටි. ඒවගේම එක්සත් ජාතික පක්ෂය පිළිකුලට භාජනය වෙන්න ගම් මට්ටමින් ශබ්ද විකාශන දාලා මාසයක් දෙකක් තිස්සේ පුලුවන් තරම් එක්සත් ජාතික පක්ෂය විනාශ කලා. එම නිසා ගරු නගරාධිපතිතුමනි මම තමුන්නාන්සේට කියනවා මේගොල්ලෝ එක්සත් ජාතික පක්ෂයේ කිය කිය කණ්ඩායම් බෙදුනා කියලා කියනවා. මේගොල්ලො කාටවත් බැහැ මේ මහ ලේකම දිපු මේ ලිපියට විරුද්ධ වෙන්න. දැන් මේගොල්ලේ මහ ලේකම්තුමාව පිලිගන්නෙත් නැහැ.ගරු නගරාධිපතිතුමනි මම අවුරුදු 24 ක් තිස්සේ මේ මන්ත්‍රීධුර රැක ගනිමින් කටයුතු කරනවා.කණ්ඩායම් සංවිධායක වරයා වශයෙන් මම කටයුතු කලා. විපක්ෂ නායකයා වෙනුවෙනුත් මම මේ සභාවේ වැඩ බැලුවා කුලරත්න පිරිස් මැතිතුමා කාලයක් පිටරට ඉන්න කාලේ. හිටපු අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මට විපක්ෂ කණ්ඩායම් නායක ධූරය දුන්නා. ඒවාගේම ගරු රංග බණ්ඩාර මහ ලේකම්තුමා ගරු රුවන් විජේවර්ධන නියෝජ්‍ය නායක, වජිර අබේවර්ධන මැතිතුමා මට මොරටුව මහ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් නායක ධූරය දුන්නා. ඒ ගරු උත්තමයානන් හට මගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා. ඒ වගේම එවැනි නිලයක් ගන්න මම මෙතනට ආවේ අපේ රාවතාවත්ත ජනතාව මට ජන්දය ප්‍රකාශ කරපු නිසා.මම පස්වතාවක් තරඟ කලා ඒ හැම වතාවෙම මම ජයග්‍රහනය කලා. ඒ නිසා තමයි අද මට එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධූර මට අද ලැබිලා තියෙන්නේ. එම නිසා ගරු නගරාධිපතිතුමනි මම ගරු කොමසාරිස්තුමාට, ගරු ලේකම්තුමාට මේ නිලධාරි මණ්ඩලයට සේවක සේවිකාවන්ට මගේ අවංක ආදාර ස්තුතිය පුද කරනවා.මම විපක්ෂ නායකයා ලෙස කටයුතු කිරිමේදි ඒ වෙලාවට මධ්‍යස්ථ මත ධාරියෙක් වශයෙන් තීරණ ගන්නවා සමහර වෙලාවට ඔබතුමාට අන්ත විරෝධිව කටයුතු කරනවා සමහර වෙලාවට පක්ෂපාතිවන සාධාරණත්වය ඉටු කරන්න පුලුවන් මොරටු ජනතාවටත් මොරටුව සංවර්ධන කටයුතු කරන්නත් මම සම්පූර්ණ මේ සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමත් එක්ක තමුන්නාන්සේට ප්‍රකාශ කරනවා. එම නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමා මේ කලාවු මේ කාර්්‍ය ලැබැදියාව කියලා ඒයා කිව්වා මේගොල්ලො එදා මොරටුව නගරාධිපතිධූරයට තරඟ කරන්න ආවේ නැහැ හැංගුනා. හැංගිලා මාව දැම්මා මමත් සුලු ජන්ද ප්‍රමාණයකින් තමයි

පරාජයට පත්වුනේ.මාව එදා ඉතිහාස ගතවුනා මොරටුව පලවෙනි මහ නගර සභාවේ කොට්ඨාශ මට්ටමෙන් පවත්වපු මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කලේ ගාවින් මත්තෙස් මහතා කියන එක කා එක්කද මේ තරඟ කලේ වසර 10 ක් තිස්සේ නගරාධිපති ධුරය දරමින් සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා එක්ක තරඟ කලේ නමුත එතුමා විශිෂ්ට ජයග්‍රහණයක් කලා. මම පරාජයට පත් වුනා නමුත් ඒක මට ගෞරවයක්. එදා නගරාධිපතිධුරයට ගාවින් මත්තෙස් හොඳයි.අද විපක්ෂනායක ධුරයට ගාවින් මත්තෙස් නරකයි කියමින් මා නිහඬ වෙනවා.

(මේ අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ඒ.රන්දූ නිරෝෂන සහ පී.එච්.මහේෂ් රුක්මාල් ඩයස් යන මහතුන් සභ ගැබට පැමිණියහ.)

**<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අභිනවයෙන් පත්වුන විපක්ෂනායක තුමාට සුභ ප්‍රාර්ථනා කරනවා.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන -

**02(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි , පක්ෂ මහ ලේකම් වරයා එවා තිබෙන තව ලිපියක් තිබෙනවා. බල මණ්ඩල සංවිධායක ලෙස යූ. අනුරසිරි ජේ ද සිල්වා මහත්මයා පිලිගන්න කියලා. එය මම සභාගත කරනවා.

## 03. සභාව අමතා එවන ලද ආයාචනා,පෙත්සම්,පැමිණිලි හා සංදේශ සභාව හමුවේ තැබීම.

**3(1) <u>මහ නගර සභා මන්ත්‍රී - පී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මා විසින් 2021 වර්ෂයේ ජනවාරි මස හා පෙබරවාරි මස ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කලා මේ මාස දෙකක් ගත වෙනතුරුත් කිසිදු පිලිතුරක් ලැබුනේ නැහැ. ගරු නගරාධිපතිතුමනි, මේක අධිකරණමය ක්‍රියාදාමයක් සිදු වෙනවා මගේ සහෝදරියට වුනු දේ.මේ සභාවෙන් මා විසින් සාධාරණත්වයක් ඉල්ලීමක් කලා කල්දමුල්ල බල ප්‍රදේශය කියන්නේ සැලසුම් අනුමත කිරිමේදී P B W වශයෙන් සඳහන් වෙන්නේ. ගරු නගරාධිපතිතුමනි, මෙහි P B S කියලා තමයි සඳහන් වන්නේ හොරට නගරාධිපතිවරයාගේ අත්සන ගහන තැන හොර අත්සනක් ගහලා මේ සැලසුම අනුමැතියක් අරගෙන තියෙන්නේ. නගර සභාවෙන් අනුමැතියක් අරගෙන නැහැ. ව්‍යාජ ලේඛණයකට ව්‍යාජ අත්සනක් යොදල නගරාධිපතිවරයෙක් වශයෙන් අත්සන් කරපු කාරණාවක් මම සභාගත කලා මේකේ නිවැරදි භාවය පෙන්නලා මෙහි වැරදි කරුවන්ට නිසි දඩුවම් දෙන්න නගර සභාවේ මැදිහත් විම මොකක්ද කියලා. මාස දෙකක් ගතවෙලා තියෙනවා නගර සභාවෙන් මේ ව්‍යාජ අත්සන කරපු පුද්ගලයට කිසිදු නිතිමය කටයුත්තකට එලඹීලා නැහැ.මේ ව්‍යාජ සැලසුම අනුමත කර ගත් පුද්ගලයාගේ නම, ලිපිනය,වරිපනම් අංකය තියෙනවා. ඔහුට නිතිමය කටයුතු කරන්න ඕන.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,දැන් මේ සම්බන්ධව නඩුවක් පවතිනවද?

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,නගර සභාවෙන් නොවෙයි භාහිර පුද්ගලයෙක් වශයෙන් නඩුවක් දාලා තියෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතමා, මේ වගේ දෙයක් තියනවා. ඔය දේපල සම්බන්ධයෙන් නම් නඩුවක් දාලා තියෙන්නේ නඩුවේදි එතුමන්ලාට කියන්න නඩුව පවරලා තියෙන්නේ දෙපාර්ශවයේ කොයි පැත්ත වුනත් කමක් නැහැ ඔබතුමන්ලාගේ සහෝදර පාර්ශවයට කියන්න මේ සම්බන්ධයෙන් නිවැරදියි කියලා උත්සහ දරන අය සම් බන්ධයෙන් සභාව සාක්ෂි කාරයෙක් විදියට ලිපිගොනුව ඉදිරිපත් කරන්න කියන්න.මේකට අධිකරණ ක්‍රියාවලියක් තියෙන නිසා සභාවේ කොතෙක් කථා කලත් අපිට කටයුතු කරන්න බැහැ. එතකොට අපිට කියන්න පුලුවන් මේක ව්‍යාජ ලේඛණයක් කියලා. එතකොට ඔබතුමන්ලාගේ පාර්ශවයෙන් නඩුව දිනනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සභාවට වුන අපකීර්තිය වෙනුවෙන් සභාව මැදිහත් වෙන්නේ නැහැනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතමා,අපකීර්තිය වෙලා තියෙන පාදක වෙන්නාවූ හේතුවට නඩුවක් තියෙනවා නම් ඒ වෙනුවෙන් පෙනි සිටින අපිට තියෙන්නේ ඒකට සාක්ෂි කාරයෙක් වෙලා ඒක සාක්ෂි කරන්න. නිකම්ම නිවැරදි වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,භාහිර පුද්ගලයන් දෙන්නෙක් විසින් නඩුවක් වැට මායිමක් සම්බන්ධයෙන් නගරාධිපතිතුමාගේ සීල් එක ගහලා ව්‍යාජ කෙනෙක් අත්සන් කරනකොට අපේ නගර සභාවට වෙච්ච අපකීර්තිය ව්‍යාජ ලේඛන කූට ලේඛණ සකස් කිරීම සම්බන්ධනේ කිසිදු නිලධාරියෙක් මේකට කිසිදු කටයුත්තක් කරලා නැහැ. හොරුන්ව ආරක්ෂා කරන්නද අපි මේකේ ඉන්නේ මෙතන.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමාට කේන්ති යන්න මේකේ මුකුත් වෙලා නැහැ.ඔබතුමාගේ නඩුවට අපිව සාක්ෂිකාරයෙක් කරන්න.නඩුවක් තියෙනකොට එහෙම කරන්න බැහැ.

**3(2)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයචනා පෙත්සම් යටතේ සභාවේ සේවකයෙකුට වුන අසාධාරණයක් සම්බන්ධයෙන් කථා කරන්නේ. කැකිල්ලේ තීන්දුවක් නගර සභාව විසින් දිලා තියෙනවා සේවකයෙක් සම්බන්ධයෙන්. ඒක තමයි නගර සභාවේ රියදුරෙක් නගර සභාවේ රාජකාරියක් නොකර නගර සභාවෙන් වාහනයක් එලියට ගන්නේ නැතුව නගර සභාවට සම්බන්ධ කිසිදු නාගරික කොමසාරිස් වරයා හෝ වාහන පාලකයා හෝ වෙනත් කිසිදු කෙනෙකු රාජකාරි පවරන්නේ නැතුව වෙනත් පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයක් මත කරපු බලපෑමක් මත නගර සභාවට අයත් වාහනයක යාම නිසා වාහනය අනතුරකට භාජනය විම නිසා නගර සභාව විසින් ඔහුට විනය පරික්ෂණයක් පවත්වලා තියෙනවා. ඒ විනය පරික්ෂන පවත්වලා ඔහුට දිලා තියෙනවා පුදුම කැකිල්ලේ තීන්දු ටිකක්.ඒ විනය පරික්ෂණය පවත්වනකොට අපිට ප්‍රශ්ණය

තියෙන්නේ නාගරික කොමසාරිස් වරයා ප්‍රධාන නිලධාරින් විශේෂයෙන්ම අභ්‍යන්තර විගණන අංශය ඒ විනය පරික්ෂණය පවත්වපු ආකාරය සම්බන්ධයෙන් අපට ගැටලුවක් තියෙනවා. මොකද හේතුව ගරු නගරාධිපතිතුමා ඔබතුමා නගරාධිපති මම මේකේ අවුරුදු අටක් නියෝජ්‍ය නගරාධිපතිවෙලා හිටියා. ධුරධාරින් දන්නවා ඔබතුමා ඕනෑම සේවකයෙකුට දෙයක් කිව්වොත් ඒ සේවකයා එකේ නීත්‍යානුකුල භාවය පිලිබඳව අවබෝධයක් නැහැ. හැබැයි ඒ සේවකයෝ ඔබතුමාට ගරු කරන නිසා ඔබතුමා කියන ඕනෑම දෙයක් කරන්නට සේවකයා ඉදිරිපත් වෙනවා. ඒ නිසා සමහර වෙලාවට අපි මේ සභාවේ සේවකයන්ට කියලා ධුරධාරින් වශයෙන් යම් යම් සේවයන් කරන්න උපදෙස් දෙනවා. හැබැයි ඒ උපදෙස් දෙනකොට කොයි වෙලාවකවත් සභාවට ඒ උපදෙස තුලින් යම් කිසි ප්‍රශ්ණයක් ඇති වුනොත් ඒ සේවකයට ඒ ප්‍රශ්නය සභාවේ විනයානුකුල තින්දුවක් අනුව ඇතිවෙන ප්‍රශ්ණයක් විදියට ගනන් ගැනෙන්න බැහැ. මොකද හේතුව නාගරික කොමසාරිස්වරයා නොවෙයි ඒ අදාල සේවකයට වගකීම් පවරල තියෙන්නේ. ගරු නගරාධිපතිතුමනි මෙතනදි විශේෂයෙන්ම මේ සිද්ධිය වෙන්නේ අප්‍රේල් මාසේ 20 දින. එදින මේ සේවකයා ඉන්නේ ගෙදර එතකොට මොරටුව මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා සේවකයට කෝල් කරලා කියනවා සුදානම් වෙන්න මට ගමනක් යන්න තියෙනවා කියලා . සේවකයා කිසිම දෙයක් අහන්නේ නැහැ ඔහු සුදානම් වෙනවා. නගර සභාවේ කැබ්රථයක් ගෙනල්ලා නවත්වනවා ගෙදර ඉස්සරහ. එතකොට සේවකයා කියනවා මම බීලා ඉන්නේ කියලා. එහෙම කියද්දිත් නියෝජ්‍ය නගරාධිපතිවරයා කියනවා කමක් නැහැ බිව්වට වරෙන් යන්න මොනව හරි ප්‍රශ්ණයක් වුනොත් මම බලාගන්නම් කියලා. එහෙම තත්වයක් උඩ ගරු නගරාධිපතිතුමනි මේ සේවකයා යනවා. එහෙම ගිහිල්ලා සේවකයා අතින් වාහනය හැප්පෙනවා රාත්‍රි 7 ට විතර. එතකොට මොරටුමුල්ල පොලිසිය දානවා රියදුරා බීමත්ව හිටියා කියලා දානවා උසාවි. උසාවියෙන් දඩයක් ගහනවා බීමත්ව සිටිම සම් බන්ධයෙන්. අනතුර සම්බන්ධයෙන් සමතයකට පත් වෙනවා ඒ මොහොතෙම.නගර සභාවේ කැබ් රථයට යම්කිසි හානියක් වෙනවා.ඒ හානිය ප්‍රතිපුර්ණ වෙනවා චෙක් එකක් දිලා රක්ෂණ සමාගමෙන්. ඒ මුදලින් තමයි මේ වාහනය හදන්නේ.ඊට අමතරව සේවකයා කොයි වෙලාවකවත් නගර සභාවේ අත්සන් කරලා නැහැ නගර සභාවේ වාහනයක් අරගෙන නැහැ.ඔහු වෙනුවෙන් වාහනයක් නිකුත් කරලා නැහැ. ගේට්ටුවෙන් වාහනයක් එලියට ගිහිල්ලා නැහැ.ඔහු තෙල් ගහලා නැහැ. ඒ වාහනය එලියට යන්නේ මාර්තු මාසේ 22 දින. හැප්පෙන්නේ අප්‍රේල් මාසේ 20 දින. කොහෙද මේ වාහනය තිබුනේ.ගරු නගරාධිපතිතුමනි මේවා හෙව්වද කොමසාරිස්වරයා. මේවා හෙව්වද අදාල බලධාරින්. මේ වාහනයට මොකද වුනේ. කොහොමද එලියට ගියේ කවුද මේකට තෙල් ගැව්වේ.කාගේ උපදෙස් මතද මේක වුනේ. මේවා හොයන්නේ නැතුව ආයතන සංග්‍රහයේ අංක ටිකක් දාලා කියනවා මෙන්න මේ අනුව ඔබ වරදක් කරලා තියෙනවා. ඒ නිසා ආයතන සංග්‍රහයේ අදාල අණපනත් පිලිබඳව සේවකයන්ට දැනුමක් නැහැ. සේවකයා ඔබතුමාට විරුද්ධව මේකේ ඉන්න සේවකයෝ සාක්ෂි දෙයිද ඇවිල්ලා දෙන්නේ නැහැ මොකක්ද හේතුව සේවකයා බයයි කියලා හදිසියේ ජොබ් එක කරන්න හම්බවෙයිද කියලා සැකය තියෙනවා. ඒක පෞද්ගලිකවත් අපිටත් තියෙනවනේ.දැන් පක්ෂ මහ ලේකම්වරයා සම්බන්ධව ගැටලුවක් ආවනේ. පක්ෂ මහලේකම් වරයාට අභියෝග කරන්න අර උදවිය බය වුනා මොකද හේතුව මොනවා හරි කිව්වොත් එහෙම මන්ත්‍රිධුරය අහෝසි වෙනවා. සියලු දෙනාම ඒක හංගගෙන ගැහැව්වේ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි පැහැදිලිව කියන්නට ඕන තමන් නොකරපු වරදකට වෙනකෙනෙක් කියපු බලපෑම් මත වාහනය එලවපු වරදට දිලා තියෙන දඩුවම් ටික බලන්න ගරු නගරාධිපතිතුමනි. අංක එක වෛයිකල්පිත විශ්‍රාම වයසින් ඔබ්බට සේවා දිගුවක් ලබා නොදිම. විශ්‍රාම ගන්නා තෙක් සියලු වැටුප් වර්ධක විලම්භනය කිරිම.මේවා හෙණ ගහන අපරාධ විශ්‍රාම ගන්නා තෙක් කිසිදු නිල වාහනයක් පැදවිමට අවසර නොදිම. විශ්‍රාම ගන්නා තෙක් කිසිදු අතිකාල දිමනාවකට සුදුසුකම් නොලැබීම.අනතුරට ලක් කල කැබ් රථයේ අලුත් වැඩියාවන් සඳහා වැය වු මුදල වැටුපෙන් වාරික වශයෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනිම යන ක්‍රම දෙකෙන් ඔබ කැමති ආකාරයෙන් අයකර ගැනිම.ඊලඟට කියනවා ආයතන සංග්‍රහයේ විනය කාර්ය පටිපාටියේ අංකයක් දාලා කියනවා පරිජ්ජේදයේ 23(9) අනුව මෙම නියෝග සියල්ල අදාල හදිසි අනතුර සිදුවු 2019.04.20 දින සිට බලපැවැත්වෙන බව දන්වමි. වැඩ තහනම් කර

සිටි 2019 .04.20 දින සිට නැවත සේවයට වාර්තා කරන තෙක් කාල සීමාව වැටුප් රහිත නිවාඩු ලෙස සලකනු ලබන අතර ඉහත සඳහන් දඩුවම් වලට යටත්ව ඔබ නැවත සේවයේ පිහිටුවීමට තීරණය කරන ලදි කියලා. ගරු නගරාධිපතිතුමනි මේ මනුෂ්‍යාගේ භාර්‍යාවට පිලිකාවක් බොහොම අමාරුවෙන් ජීවත් වෙන කෙනෙක්. මේවද නගර සභාවේ දෙන තීන්දු මේවා ගන්නේ කවුද? මෙහෙම දඬුවම් කරන්න මොකක්ද කරලා තියෙන්නේ.මිනියක් මරලද?කොහොමද මෙහෙම දඬුවම් කරන්නේ ඔහු වාහනය අරගෙන නැත්නම්. ඔහුට වාහනය පදවන්න නගර සභාවෙන් උපදෙස් දීලා නැත්නම්. ඔහුට රාජකාරි පවරලා නැත්නම්. දේශපාලඥයකුගේ බලපෑම් මත මේ රියදුරෙක්ව භාවිතා කිරිම ඔහු මොකක්ද කරපු වරද ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මම ඔහු දිව්රුම් පෙත්සමක් මගින් මට කියපු කරුනු මේ සභාවට ඉදිරිපත් කරලා තියෙනව. මේ දිවුරුම් පෙත්සමේ අවසානයේ ඉල්ලීමක් කරනවා මේ සභාවෙන් හා ඔබතුමාගෙන් ඔහු ඉල්ලිමක් කරනවා ඔහුට සාධාරණයක් කරන්න කියලා. ඒ නිසා නගරාධිපතිතුමනි අටුවා ටීකා ටිප්පලි අවශ්‍ය වෙන්නේ නැහැ මේකට තර්ක කරනවානම් ඕන තරතම් කරුණු මා ලඟ තියෙනවා.ඒකට ලැස්ති වෙලයි ආවේ.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි පැහැදිලිව කියන්නට ඕන මම මේක සභාගත කරනවා.ඒ නිසා අපි ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් කරලා ඔහුට සාධාරණය කරන්න කියලා ඉල්ලා සිටිනවා. හේතුව ඔහුට සිදු වුන විශාල අසාධාරණයක්. මේක අපි දේශපාඥයෝ විදියට අපිටත් ලොකු ආදර්ශයක් පාඩමක් වෙනවා මේ ප්‍රශ්නෙදි. ඒ නිසා අපිත් සේවකයෝ යම් යම් දේවල් වලට භාවිතා කරනකොට පරිස්සමෙන් භාවිතා කරන්න ඕන. හැබැයි ඒ භාවිතා කිරිමේදි අපේ දෙයකට භාවිතා කරලා යම් කිසි දෙයක් වුනොත් වගකිම අපි භාරගන්නට ඕන. මේ අහිංසක සේවකයන්ගේ පිටින් යවන්නේ නැතුව.ඔබතුමාගේ කාරුණික අවධාන යොමු කරන්න කියන කාරුණික ඉල්ලීම කරනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතුතමා සඳහන් කලේ මම හිතන්නේ මගේ දෙයක් වශයෙන් මේ අවස්ථාවේදි විශ්වාස කරනවා.ඔය වෙලාවේ මම මේ උත්තරිතර සභාවේ කියන්න ඕන පැහැදිලිවම මෙතුමත් බෞද්ධයෙක් මමත් බෞද්ධයෙක් තමන් දේශපාලනය කරනවා නම් කවුරු හරි කමක් නැහැ තමන් හිතට එකඟව මේ හොයලා බලල කියනවා නම් තමයි අපි ඉගෙන ගත්තු ධර්මය තුල තියෙන්නේ. මම නම් හිරේ විලංගුවේ වැටිලා නැහැ ගරු නගරාධිපතිතුමනි. මනුෂ්‍යයෙකුට කරන්න ඕන විනය ශිලාචාරවම විදියට මේ කටයුතු කිරිම සම්බන්ධයෙන් මගේ කණගාටුව මේ අවස්ථාවේදි පුද කර සිටිනවා. විශේෂයෙන්ම ඔය කියන රියදූරා එවෙලාවේ මම කවදාවත් කිසිම දවසක බීමත් රියදුරන්ව පාවිච්චි කරන්න තරම් මෝඩයෙක් නොවයි. ඒ නිසා ඒක මම සම්පුර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.ඒක කවදාවත්ම සිදු වෙච්ච නැති දෙයක්. මම හිතන්නේ කාගේ හරි උවමනාවකට ඔය කියන දඬුවම් ටික දිල මේ තත්වයට පෙරලන්න උත්සහයක් දරන්න ඇති කියලා මට මේ අවස්ථාවේදි හැගෙනවා. එතුමාව ග්‍රහණය කරලා ඒ රියදුරු මහතාට ඔය තරම් දඬුවම් ටිකක් දීලා වක්‍රාකාරව මෙතනට ගෙනල්ලා මේ දඬුවම් ටික ලබා දෙන්න ඕන ක්‍රියා මාර්ගයද මේ සිද්ධ වෙන්නේ කියන එකද මට ඉතාම පැහැදලිතාවයක් නැති වෙනවා. කරුණාකරලා ඔබතුමා අපි විශ්වාස කරනවා අපේ නායකයා නගරාධිපතිවරයා වශයෙන් අපි හැම අවස්ථාවකම ඔබතුමාව පිලිඅරගෙන තියෙනවා. මේකට සාධාරණ විදියට පරික්ෂණයක් පවත්වන්න.රියදූරා බිලා හිටියානම් මම මගේ වචනයේ පරිසමාප්තයෙන්ම කිසිම දිනයක මගේ වාහනයට මම නග්ගගන්නේ නැහැ. ඒක විශ්වාස කරන්න කියන එක මම කියනවා. හැබැයි මේකට මුණ දෙන්න මට බොහොම ශක්තියක් තියෙනවා. මම අභියෝග වලට ඉතාම ආස කරන මනුෂ්‍යයෙක්.අභියෝග වලට ආදරය කරන මනුෂ්‍යකේ වශයෙන් මට මේක සුලු දෙයක්. ඔබතතුමන්ලා ඕනැම ක්‍රියාමාර්ගයක් ගත්තත් මට කිසිම ගැටලුවක් නැහැ. මගේ හෘද සාක්ෂිය දන්නවා මම ඒ වගේ වැරදි වැඩක් කරලා නැහැ කියන එක.රියදූරා බිලා හිටියානම් ඒ රියදූරා දිවුරුම් ප්‍රකාශයක් දීලා තියෙනවා නම් ඒ රියදූරාගේ දේවල් ටික හදා ගන්න මෙහෙම කරපන්, මෙහෙම ප්‍රකාශයක් දීපන්, කියලා තියෙනවා නම් ඒකත් ඔහු දීලා තියෙනවා නම් ඔහු රියදුරෙක් වශයෙන් බීමත්ව රථයකට ගොඩවීම සම්බන්ධයෙන් නැවත පරික්ෂණයක් පවත්වන්න. මොකද බිමත්ව රියදුරෙක් වාහනයක් ගන්න බැහැ ඔහු ඒක ප්‍රතික්ෂේප කරන්න පුලුවන් කිසි දිනක ඔය

කියන දේවල් සත්‍ය දේවල් නොවෙයි. අමුලික-අමුලික-අමුලික බොරු සසර අපාගත වෙන බොරු ඒ නිසා මේවා පුද්ගලික වෛර ඇති වෙන්න පුලුවන්. හැබැයි මෙතුමා හිරේ ඉන්නකොට මම බලන්න ගිහිල්ලා මෙතුමට දුන්නේ මෙන්න මේක දුන්නේ.රත්නමාලි ගාථා රත්නය දුන්නා කියවන්න කියලා.මෙතුමගේ තියෙන කුහක කමට තුජ්ජ කමට මේවා කරාට මේවා මනුෂයෝ කරන වැඩ නොවෙයි. එනිසා නිසි පරික්ෂණයක් පවත්වන්න. ඒ රියදුරා බිලා මම බලෙන් නගින්න කිව්වෙත් නැහැ මමත් දිවුරුම් ප්‍රකාශයක් දෙනවා එහෙම දුන්නේ නැහැ කියලා. ඔබතුමා නිසි පරික්ෂණයක් පවත්වන්න ඔබතුමා පක්ෂපාති වෙනවද නැද්ද කියලා මම දන්නේ නැහැ.ඒ නිසා එහෙම නොවෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා.මේ වගේ කැත දේශපාඤයෝ සසර වසන තුරාවට අපිට දකින්න නොලැබෙවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මම හිතනවා සුජිත් පුෂ්ප කුමාර ගරු මන්ත්‍රිතුමා දිවුරුම් සහතිකයෙන් ඉදිරිපත් කරලා යම් කරුනු ඉදිරිපත් කලා. නියෝජ්‍ය නගරාධිපතිතුමා කියනවා යම් විදියකට මේකේ ඒ වෙලාවේ ඒ දඩුවම දෙන්න ඇත්තේ කාගේ හරි බලපෑමකට කියලා. දෙන්නම් මේ අභියෝග කරලා තියෙන්නේ මටද කියලා මටත් ලොකු ප්‍රශ්ණයක් තියෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම ඔබතුමාට එල්ල කරන්නේ නැහැ නගරාධිපතිතුමා.ඔබතුතමා කොහොම කොයි දේ කලත් යම් වගේ අවස්ථාවාල එහෙම වෙන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. නමුත් මම විශ්වාස කරනවා ඒ රියදුරු මහත්මයා මාත් එක්ක ඔය කිසි දෙයක් කියලත් නැහැ.මාත් එක්ක ආවාම වෙන වෙන දේවල් කථා කරන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා, මම ඔය සිද්ධියේදි කියපු දේවල් එකක්වත් සභාවට කියන්නේ නැහැ.හේතු ගොඩක් තියෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කිසිමදිනක නිල රථයක කවදාවත් බෝතලයක් ගෙනියන්න ඉඩ තියලා නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා,ඔය අනවශ්‍ය දේවල් කියන්න යන්න එපා සභාවේ. මාධ්‍ය ජාලය තුල අපිට ආපු දේවලුත් තියෙනවා.ඒවා පැත්තකට දාගමුකෝ.එකම දේ තියෙන්නේ තමන් නිවැරදි වෙන තාක්කල් තමන්ව ධර්මයෙන් අර්ථයෙන් ඔක්කොම ආරක්ෂා කරනවා.ඒක මම විශ්වාස කරන්නේමාව හැම තිස්සේම අර්ථයෙනුත් ධර්මයෙනුත් ඥාණයෙනුත් මාව පෝෂණය කරලා තියෙනවා. විශේෂයෙන්ම මේ වෙලාවේදි කටයුතු කරන්න ඕන විදිය මොකක්ද කියන එක කවුරු කවුරුත්-කවුරු කවුරුත් පාඩම් ඉගෙන ගත්තොත් මේ ප්‍රශ්ණ මෙහෙම වෙන්නේ නැහැ. තමන්ට ප්‍රශ්ණයක් වුනාම ඒ ප්‍රශ්නයට විසඳුම ක්ෂණිකව සොයන්න ගියාම ඊලඟ ප්‍රශ්ණය තමන්ගේ වුනාම ඊලඟ කෙනත් ක්ෂණිකව සොයනවා ප්‍රශ්නයට උත්තරයක්.ඒ නිසා කරුනාකරලා විදිමත් විදියට ඒවා ගැන නිවැරදි විදියට සොයා බලන්න ඕන. ඒ සොයා බැලිම කලානම් සත්කුමාර මහත්මයා අදටත් ඔබතුමාගේම වාහනයේ රියදුරා වෙනවා. මට මතකයි

මේක ප්‍රදීප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා හොඳටම දන්න කාරණයක්. අපේ මියගිය රංජිත් රියදුරා මගේ වාහනයට රියදුරෙක් විදියට ආවේ. මම ඒ පුද්ගලයට රැකියාව දීලා හැමදාම උදේ 6.30 ට මම වාහනය හෝදනවා මට කැත නිසා. එක දවසක් මම එනවා ආයුර්වේද පාරෙන් එතකොට බිලා හිටියේ පුසෙක්ව යටකලා යට කරපු ගමන්ම මම කිව්වා පුසා යටවුනා කියලා. එතකොට නැහැ කියලා කිව්වා. මම කිව්වා උබ බැහැලා ගිහිල්ලා උදැල්ලක් අරගෙන වලලලා වරෙන් කියලා එදා ඉදලා බැස්සුවා බැස්සුවා මයි මම ආයේ ගත්තේ නැහැ.ඒ වෙලාවෙදි කවුරු හෝ කුමන හෝ විදියකින් නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ වාහනය තමයි අනතුර වෙලා තිබුනේ.ඒ අනතුර වෙලා තිබුනේ හමුදාවේ රථයක් එක්ක. මම හිතනවා ඒ ඇති වුනාවූ සිදුවීම ඔක්කොම සමතයකට පත් කරන්න පුලුවන් වන නායකත්වය ඔබතුමා එවෙලේ දුන්නානම් හරි.ඒ වෙලාවේදි දුන්නේ නැහැ. මට තව එකක් ඔබතුමාට කියන්න තියෙනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ඒ වෙලාවේ හිටියේ ගෙදර මම පොලිසියට යනකොටත්

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා,ඔබතුමා ඒ වෙලාවේ නායකත්වය අරගෙන ඒක බේර ගත්තා නම් අද මේ ප්‍රශ්ණය නැහැ.මම හදිසියේ මරණ ගෙදරක යනවා ඒ වෙලාවේ මට රියදුරු බලපත්‍රය නැහැ හරියටම පැස්කෝ එක ඉදිරිපිට යාචක අම්මා කෙනෙක් හැපුනා. ඔලුවේ ලොකු ගෙඩියක් ආවා. හැබැයි මම නොවෙයි කියන්න මම උත්සහ කලේ නැහැ.මම එහෙමම දල්පදාදූ මහත්මයා ළඟට ගිහිල්ලා බෙහෙත් දැම්මා.මම එක්කෙනුට සල්ලිත් දීලා ආවා මොකක් හරි වුනොත් මට කියන්න ගෙනියන්න.පහුවෙනිදා මම ගිහිල්ලා හැම තැනම හෙව්වා මට බය හිතුනා මෙයාට මොනවා හරි වෙයි කියලා. පස්සේ ඒ යාචකයා ඉන්න තැන මම හොයන කොට රාත්‍රී 1.00 ට විතර සිටි ෆාමසි එක ලඟ අගුවේ නිදාගෙන ඉන්නවා.මම ගිහිල්ලා ඇහැරවලා ඇහුවා අම්මේ මොකක් හරි අමාරුවක් තියෙනවද කියලා මට තේරුනා අම්මට අමාරුවක් නැහැ කියලා. අම්මා මට කිව්වා ලැජ්ජා නැද්ද මේ 1.00 ට විතර ගෑණු කෙනෙක්ව ඇහැරවන්න කියලා. මට හිතුනා ඔලුවේ ගෙඩියක් ආවට කල්පනාවක් තියෙනවා කියලා මම එවෙලෙම පිටත් වුනා මල ගෙදර යන්න. ඒ වගකීම් ගන්න ඕන. මනුෂ්‍යයෝ විදියට වුනු දේ මොන වෙලාවක හරි වගකිම ගන්න ඕන.ඒ නිසා වගකීම් ගන්න ඕන වෙලාවේ වගකිම ගන්නවා නම් මේ වලාවේ උත්තර තියෙනවා.මම හිතනවා දිවුරුම් සහතිකයක් දුන්නට පස්සේ ඒ පිලිබදව කටයුතු නොකර ඉන්න බැහැ අපට කොමසාරිස්තුමා විදිමත් වු පරික්ෂණයක් පවත්වලා මට හොඳටම මතකයි රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා සභාවේ නැහැ එතුමා නන්දසිරි අප්පුහාමි දෙකහමාරක් මරාගෙන එනකොට එක්තරා වයින් ස්ටෝර්ස් එකකට ඇතුල් වුනා ඒ වෙලාවෙත් බිලා හිටියේ ඇත්ත කාරණය ඒකයි. මේ මනුෂ්‍යා බේර ගන්න ගත්තු උපාය. ඒ උපායක් අරගෙන මේ මනුෂ්‍යා බේර ගන්න තිබුනා. එක පාරටම කිව්වා මේ මනුෂ්‍යාට පොවන්නත් ඕන පොවන්නේ නැතුව මේක බේර ගන්න බැහැ බීල හිටියේ නැහැ කියලා. ඒ වෙලාවේ සුදු අරක්කු ටිකක් ඒ වෙලාවේ ගහන නිසා හති හති කියලා බිව්වා. බිලා බලනකොට බිලා තියෙන්නේ සුදු අරක්කු.වතුර කියලා හිතාගෙන සුදු අරක්කු බිල තියෙන්නේ කියලා ඒ කථාව ගිහිල්ලා ගිහිල්ලා නන්දසිරි අප්පුහාමිට යම් කිසි සහනයක් ආවා. මේකත් කරන්න තිබුනා ඒ වගේ උපක්‍රමයක්.යම් දෙයක් වුනාම ඒකට හරියන්නාවූ උපක්‍රම යොදවලා අපි නිසා වුනු හානිය වැලැක්වීම සඳහා උපක්‍රයක් යොදවන්න තිබුවා. මේ කියන කථාව ඇත්ත. නෝනට කැන්සර් එකක්.බෞද්ධ කටයුත්තකදි, සමාජ කටයුත්තකදි දායක වෙන හොඳ

නෝනා කෙනෙක්. හැබැයි අද එයාගේ ලෙඩේට බේතක් කරගන්න විදියක් නැහැ මෙයාට තිබෙන්නේ ලැබෙන්නාවූ වැටුපක් පමණයි. අවුරුදු 10-15 ක් සිට වැටුපකට වැඩියේ අතිකාලත් එක්ක ජීවත් වුනු කෙනෙකුට අද වැටුපත් එක්ක ජීවත් වෙනකොට ලොකු ප්‍රශ්ණයක් තියෙනවා. විධිමත් වූ පරික්ෂණයක් පවත්වලා නිවැරදි කරු කවුද කියන එක තෝරගෙන මේ කටයුත්ත කරන්න කියන කාරුණික ඉල්ලීම කරනවා.

**3(3)** **<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අංග සම්පූර්ණ දැනුමෙන් සම්පූර්ණ වුනු ආගමෙන් සුරකින් ඒ හැකියාවන් දක්ෂතාවයන් පිලිඹිබු කරන නගරාධිපතිතුමෙක්ගේ පාලනය එහි මහසභාව 11.30 වෙනතුරු කථා කරන ලද සිදුවීම් පිලිබදව යම් මොළේ කඳුලක් දැනුමක් අවබෝධයක් තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙන දේ තමයි ගරු නගරාධිපතිතුමනි තමන්ගේ පක්ෂේ තමන්ගේ පැත්තේ තමන්ගේ තිබෙන ගැටලු මේ සභාවට එන සමහර ඒවා හොඳයි ඒ සංවාද සාකච්ජා කරනකොට මේ පාලනයට වෙලා තියෙන වින්නැහියේ තරම මොකක්ද කියලා තේරෙනවා.ඒ නිසා ඒ තරම තමුන්නාන්සේට ඒත්තු ගන්වන එක ඔබතුමාට ලේසි නැහැ. හිටපු නියෝජ්‍ය නගරාධිපතිතුමා කියපු කථාවක් තියෙනවා කැකිල්ලේ තීන්දුව. කැකිල්ලේ තීන්දු එනවා තමයි කැකිල්ලේ රජ්ජුරුවෝ ඉන්නකොට. එනිසා ඔහු මතු කරපු කාරණාව ඇත්ත - නැත්ත, සත්‍ය - අසත්‍යතාවය අපි දන්නේ නැහැ පරික්ෂණයක් කරන්න. නමුත් ඒකම පාදක කරගෙන තමයි මගේ මේ පෙත්සම පෙත්සම් පැමිණිලි යටතේ තමයි මේ කාරණය ඉදිරිපත් කරන්නේ.

ගරු නගරාධිපතිතුමනි ඔය කියන විදියට සේවකයින්ගේ අනාරක්ෂිත බවක් සේවකයට වෙන වින්නැහියක් ඒකට වගකිව යුතු යැයි දේශපාලඥ ඒක තමයි ඒ සාකච්ජාවේ හරය. ඒ ගැන තමයි අද මේ මහ නගර සභාව මේ පාලනය මොරටුවේ පොදු ජනතාවගේ මේ ආයතනයේ සේවාවන් ලබා ගැනිම සඳහා එන ඒ සේවා ස්ථාන වල අතිතශ්‍ය අනතුරුදායක ඔවුන්ගේ ජීවිත වලට ඉතාම අනතුරු දායක තත්වයකට ගොදුරු වෙලා තිබෙනවා මේ පාලනයට වගේ වගක් නැති වෙලා. ගරු නගරාධිපතිතුමනි ඔබතුමා ප්‍රමුඛ මේ පාලන මූලික වගකිමක් තමයි මොරටුව ජනයාගේ ජීවිත වලට වගකිය එක. මේ ආයතනයේ සේවකයන්ගේ ආරක්ෂාවට වග කියන එක.හැබැයි එය සම්පූර්ණවම බිඳ වැටිච්ච තත්වයක් තුල තමයි මම උත්සහ කරන්නේ මේ තත්වය හොඳින් ඒත්තු ගන්වලා මෙය ඉතා වේගයෙන් වෙනස් කරන්න. එය වෙනස් කල යුතු දෙයක්.ඔබ දන්නවා ආසන්නම සිද්ධියක් මම මේ සිද්ධි ගන්නේ ඔබ සිද්ධි වලට ලඝු වෙන්න යන්න එපා. සිදුවීම් වලට ලඝු වෙන්න එපා ඒ සිදුවීම් වල තිබෙන අඩුව තේරුම් අරගෙන එය නිවැරදි කරයි කියන විශ්වාසයෙන්. කැකිල්ලේ තීන්දු නම් දෙන්න එපා. ඔබ දන්නවා පහුගිය දිනක ලක්බිම පුවත්පතේ අපේ සොයිසා ක්‍රිඩාංගනයට එනවා තාත්තයි දුවයි කඩාගෙන වැටෙනවා වහලේ පංගුවක් තාත්තයි දුවයි රෝහලේ.අසාද්‍යයි කියලයි වාර්තා කලේ. මේ වහල කඩාගෙන වැටුනේ ඒ වෙලාවේ වුනාට වැටෙන බව පෙනුනේ බොහෝ කාලයකට පෙර. මමත් ඔය ක්‍රිඩාංගනය නිරික්ෂණය කලා. ඒ වෙලාවේ වගකිව යුතු අයට කිව්වා.ජනතාවගේ ආරක්ෂාව පිලිබදව තිබෙන මේ පාලනය වුවමනාව නොසැලකිල්ල විසින් ඔය අනතුර සිදුවුන බව අපට ඒත්තු වෙන්නේ. එලියට එනකොට පිවිසුම් දොරටුවේ කොන්ක්‍රිට් ලැල්ලක් නැහැ ඒ අවස්ථාවේදිම කොමසාරිස්තුමාට කථා කරලා කිව්වා. ගරු නගරාධිපතිතුමනි ඔබ යටතේ තිබෙන මහ ජනතාවගේ සුභ සාධනය සේවාවන් පවත්වන ස්ථාන වල මේ තිබෙන අනතුරු දායක තත්වය මම දීර්ඝ කාලයක් තිස්සේ කියනවා ඊ ලඟ අනතුර ජයගත් පුර ක්‍රිඩාංගනය වහල ශීට් ගැලවිලා ගිහිල්ලා ආරක්ෂික වැට ගිහිල්ලා එතන අනතුරක් හෙට වෙන්න නියමිතයි. කථා කර කර ඉන්නවා පිලියම් යොදන්නේ නැහැ. ඒ විතරම නොවෙයි ලුනාව කලපුවේ පහුගිය දවසක සෙල්ලම් කරන්න ආපු තරුණයෙක් නගර සභාව හාරපු කලපුවේ මතුවෙලා තියෙන රෙන්මඩ වලින් පුරවපු වලට තරුණයා යනවා පිරිසක් හිටපු නිසා බේර ගන්නවා නැත්නම් ඔහු එතනමයි. ඒ ස්ථානයේම සිහිති උයනක් තියෙනවා ඒ බඩු භාණ්ඩ කැඩිලා බිදිලා තමයි හැබැයි ඒ මුලු ඉඩමම හාරලා කලපුවේ රොන් මඩ දාලා කිසිම ආවරණයක් නොකරපු තත්වයක් නිසා හෙට දවසේ

එතන අනතුරක්. ගරු නගරාධිපතිතුමනි දිගින් දිගටම කියන්න පුලුවන් මොරටුව ජනතාවට මේ ස්ථානයෙන් සේවා සපයන අතිශා අනතුරු දායක තත්වයට පත් වෙමින් තියෙනවා පාලනයට වගේ වගක් නැතිව ඉන්නවා. මම දැක්කා පාරවල් කාපට් කරනවා.වැඩ පිලිවෙලක් නැහැ නගරාධිපතිතුමනි. කාපට් කරන පාරේ මිනිස්සු ගමන් කරනවා.ඒ යන්ත්‍රසූත්‍ර වැඩ.කිසිම ආරක්ෂාවක් නැහැ.මේවා වලක්වන්න තමයි මේ ආයතන තියෙන්නේ.මගේ ප්‍රධාන විවේචනය තියෙන්නේ පාලනයට වගේම පරිපාලන නිලධාරින්ට කොන්ක්‍රිට් ලැල්ලක් දාන්න කිව්වම නැවත නැවත මතක් කර කර ඉන්න ඕන. වාහනයක් ගිහිල්ලා දින දෙකක් යනකම් වාහනය අහන්නේ පරිපාලනය මොකක්ද කරන්නේ.ඒ නිසා ඔබතුමා මොනවා කිව්වොත් මම දන්න විදියට ඔබතුමා උගන්නේ නැත්තේ මාලුන්ට පීනන්නයි. කුරුල්ලන්ට පියාඹන්නයි විතරයි.වඳුරන්ට පනින්නයි. ඔබතුමා හැම අවබෝධයකම ඉන්නවනේ. හැබැයි ඔබ යටතේ වාහනයක් නැති වෙනකොට ඔබ දන්නේ නැහැනේ. ඔබ යටතේ කාගේ හරි වහලක් කඩාගෙන වැටෙනවා ඔබ දන්නේ නැහැනේ. ඒ නිසා තමයි මේ අවධාරණය කරන්නේ වහාම මේවා ආරක්ෂිත තැන් කරන්න.මේ තියෙන්නේ පක්ෂ පිලිබඳ ප්‍රශ්ණ නොවෙයි. ජනතා නියෝජිතයෝ විදියට ඔවුන්ගේ ජීවිත වලට වගකියන වගකීමේ වුවමනාව. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි දැකපු දේ ටික වුනාට නොදැකපු දේ බොහෝයි.

**3(4)** <u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ජනතාව බොහෝ අමාරුවෙන් ඉන්න වෙලාවක නමුත් මහ නගර සභාව කරන සේවාවන් ගැන සහ නීතිමය බැඳීම් නිසා මම නිතර දෙවේලේ දකිනවා බදු ගෙවන්න එනකොට අපි එක කවුලුවක් පවත්වාගෙන යනවා මිනිස්සු පෝලිමේ ඉන්නවා. වැඩ කරන ජනතාව බදු ගෙවන්න පෝලිමේ ඉන්නේ නැතිව කවුලු 2-3 ක් දාලා ඒක කරන්න කියන ඉල්ලිම කරනවා.

**3(5)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මාසේ 15 වෙනිදා පාසැල් ආරම්භ කරනවා කියලා කථාවක් තියෙනවා. ඒ කට සාපේක්ෂව පෙර පාසැල් ආරම්භ කරන්න කියලා ප්‍රාදේශිය කාර්යාලයෙන් පෙර පාසැල් හා ප්‍රජා සංවර්ධන අංශයට දැනුම් දීලා තිබුනා. පෙර පාසැල් ආරම්භ කිරිම සම්බන්ධයෙන් මම විමසිමක් කලා ළමා හා කාන්තා කාර්්යංශයේ මුල් ළමාවිය සංවර්ධන අධ්‍යක්ෂක තුමියකට එතුමිය මට කිව්වා පෙර පාසැල් ආරම්භ කිරිම සම්බන්ධයෙන් සම්පූර්ණ තින්දු ගන්නේ ප්‍රදේශයේ කෝවිඩ් මර්ධන කාර්ය සාධක කමිටුව තමයි කියලා.මම ප්‍රාදේශිය ලේකම්ට කථා කලාම කිව්වා එහෙම කමිටුවක් තවම කැඳවලා නැහැ නමුත් මොරටුව M O H කාර්යාලය දෙකෙන් මේ වෙනකොට පෙර පාසැල් ආරම්භ කරන්න හොඳයි කියන නිර්දේශය දෙන්නේ නැහැයි කියලා.ගරු නගරාධිපතිතුමනි මට මතු කරන්න තියෙන කරුණ තමයි මේ වෙනකොට මොරටුව ප්‍රදේශයේ පෞද්ගලික පෙර පාසැල් ආරම්භ කරලා තියෙනවා. අපි රාජ්‍ය ආයතනයක් ඒ විදියට කරන්න බැහැ. බලාගෙන ඉන්නවා සෞඛ්‍ය අංශ නිර්දේශ එනකම්.නමුත් ඒ ගොල්ලො නිර්දේශ දෙන්නේ බාගෙට කැමති නම් පටන් ගන්න. මේ විදියට බෝල පාස් කරනවා නම් දරුවන්ට මොකද වෙන්නේ. සෞඛ්‍ය නිර්දේශ ලැබුනට පස්සේ පටන් ගන්න කියලා කියනකොට අපිට දරුවෝ නැහැ. පෙර පාසැල් පද්ධතිය කඩාගෙන වැටිලා. මොරටුව ප්‍රදේශය අවදානම් නම් මොනම පෙර පාසැලක්වත් පටන් ගන්න බැහැ.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු සුරේශ මන්ත්‍රිතුමා සමාවෙන්න, ගරු නිශාන්ත මන්ත්‍රිතුමා මට කිව්වා කුරුල්ලන්ට පියාඹන්න උගන්නනේ නැහැ, මාලුන්ට පීනන්න උගන්වන්නේ නැහැ, වඳුරන්ට,රිලවුන්ට පනින්න උගන්වන්නේ නැහැ අනිත් ඔක්කොම උගන්වනවා කියලා. සමහර වෙලාවට නගරාධිපතිවරයා කවුද කියන එකට වඩා නගරාධිපතිවරයාගේ වගකීම මොකක්ද කියලා කටයුතු පිලිබඳව

සහයෝගයක් නොදැක්වීම හේතුව නිසා ගරු නිශාන්ත මන්ත්‍රීතුමාම ඔය පුටුවේ ඉඳගෙනම කිව්වා මෙහෙම එකක්. ඔබතුමත් එක්ක කටයුතු කරන්න අකමැත්තක් තියෙනවා නම් වෛද්‍යවරු කැමත්ත තියෙන කෙනෙක් එක්ක එකතු වෙලා හරි කමක් නැහැ මේ කොවිඩ් එක අපි බේර ගමු කියලා. මට තියෙන ගැටලුව ඇත්තටම පීනන්න උගන්නන්නේ නැහැ මාලුන්ට.මට බැරි නිසා කුරුල්ලන්ට පියාඹන්න උගන්නනේ නැහැ මට බැරි නිසා හැට පැන්නත් පනින රිලවුන්ට ඉනිමං ඕන නැහැ කියලා දන්න නිසා ඒක උගන්නන්නෙත් නැහැ මම. හැබැයි මෙන්න මේක පොඩ්ඩක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා මම එදා ඒ වෛද්‍ය වරයාගේ ප්‍රශ්ණය නිරාකරණය කර ගන්න අපිට සභාවක් විදියට එතනට ගිහිල්ලා වෛද්‍ය වරයාගෙන් අනවශ්‍ය දේ විතරක් අරගෙන නගරාධිපතිවරයාගේ බලපෑම විතරක් කරගෙන සභාවේ කථා නොකර ඔබතුතමන්ලා මේ වෙලාවේදි කල යුත්තේ ඒකට සුදුසුම දේ එතන තියෙන්නේ පලාත් පාලන ආයතන ඒකත් එක්ක එකතු වෙලා වැඩ කරන්න කියන පණිවිඩය නොතිබුන නිසා ශාන්ත සෙබස්තියන් දෙව් මැදුරේ පියතුමා මංගල්‍ය කරාට පස්සේ මංගල්‍ය නවත්වන්න කියලා වෛද්‍යවරයා කියනකොට ඒකට පොලිසියෙන් අවසර දිලා මංගල්‍ය කරාට පස්සේ ඒ වෛද්‍යවරයා යනවා පොලිසියත් එක්ක ගිහිල්ලා බලෙන් PCR කරන පියතුමා ඒවගේම සභාව තියෙනකොට සභාව තියන්න එපා එලියේ ගිහිල්ලා බාගෙට බාගයක් තියන්න කියන වෛද්‍ය වරයා අද පෙර පාසැල් ටික ඔක්කොම පටන් ගන්න කොට අර පියතුමාට කරපු දේ කරන්නේ නැහැ. පෙර පාසැල් වලට කරුනාකරලා නවත්වන්න කියලා කියන්නේ නැහැ අපේ පෙර පාසැල් වලට එවලා තියෙනවා මේවා පැවැත්වීම නුසුදුසුයි තියන්න එපා කියලා. මම කියන්නේ ඒක සමන්ලාල්ටද වෛද්‍ය වරයාගෙන් අපි බලාපොරොත්තු වූ දේ කරගන්න බැරි වුනේ වෙන මුකුත් නොවෙයි තනිකරලා නගරාධිපතිවරයාට ගහන්න පටන් ගත්තා වෛද්‍යවරුන් එක්ක වැඩ කරන්න දන්නේ නැහැයි කියලා. සමන්ලාල්ට වැඩ කරන්න දන්නේ නැහැ කා එක්කවත් කියලා තනි කරලා ගැහැව්වා අන්තිමට වෙලා තියෙන්නේ වෛද්‍ය වරයා අද තනි වෙලා නන්නත්තාර වෙලා අද එක ගමකට එන්නත් එවනවා. තමන්ට ඕන විදියට සමහර අය එක එක විදියට රෙජිස්ටර් කරන්න කියලා එක එක තැන්වල නම් දෙනවා. අද එක එක තැන්වලට යවනවා. හැබැයි දෙවන රැල්ල ආරම්භ කරන්නේ විල්ලෝරාවත්තෙන් අද එක එන්නතක්වත් එහෙට නැහැ. මගේ තාත්තට අවුරුදු 84 ක්. මම එන්නත ලබාගෙනත් නැහැ. එදා සෞඛ්‍ය වෛද්‍ය වරුන්ට ගිහිල්ලා ගෙනා පුද්ගලයා නොවෙයි යා යුතු තැන එතන අපි වැඩ කරමු කියලා උපදෙසක් දුන්නා නම් ඩොක්ට එහෙම වැඩ කරන්න එපා එයාගේ කේන්ති අපට වැඩක් නැහැ අපි එකතු වෙලා වැඩ කරමු කිවුවා නම් හරි හැබැයි එතනින් ගත්තේ සමන්ලාල්ගේ අඩු පාඩු අරගෙන ඇවිල්ලා සභාවේ කථා කරපු එක තමයි කලේ. ඒ නිසාම අද මොරටුවේ වගකියන මන්ත්‍රීවරුන්ගේ සමහරක් තීරණ නිසා අද විශාල ප්‍රශ්ණයක් වෙලා. ඔබතුමා ඔය කියන එක හරි. මට පෙර පාසැල් වල එක්කෙනෙක් ඇවිල්ලා ඉල්ලුවා මම සෞඛ්‍ය වෛද්‍ය වරයාගේ ලිපිය දුන්නා. අපිට විතරක් නොවෙයි අධ්‍යාපන අමත්‍යාංශයටත් එතුමා ලිපියක් දිලා තියෙනවා.පාසැල් වත් පටන් ගන්න මම ඉඩ දෙන්නේ නැහැ කියලා. ඒකයි තත්වය.ඒක නිසා දහසක් දේ මගේ වැරදි තියෙන්න පුලුවන් හැබැයි හරි දේ සහ සභාවට කරන්නට පුලුවන් දේත් එක්ක එකතු වෙන්න. එහෙම එකතු වුනාම වෛද්‍ය වරයා අපිට උඩින්ද යටින්ද කියලා නොවෙයි නගරාධිපති උඩය යටද කියලා හොයන්න එපා. අපි එහෙම හොයපු නැති සභාවක් නොවෙයි. ඒක නිසා කරුණාකරලා අපිට රැස්විම තියන්න වත් නොදිපු වෛද්‍ය වරයා කොරෝනා රැස්විමකට අඟහරුවාදා දිනයක එම සෞඛ්‍ය වෛද්‍ය වරයාම ලිපියක් එවනවා කොරෝනා රැස්විමට එන්න බැරි හේතුව අපිට අද දිනයේදි මාසික ප්‍රගති සමාලෝචනය සියලුම මිඩ්වයිෆ්ලා , නර්සස්ලා, වෛද්‍ය වරු හැමෝම අපේ රැස්වීමක් ඒක නිසා එන්න බැහැ කියලා අපිට ලියුමක් එවනවා අපේ සභා රැස්විම තියෙන්න එපා ගහක් යට තියන්න කියලා එම වෛද්‍ය වරයාම අපිට ලියුමක් එවනවා. ඒ වෛද්‍ය වරයා කරන දේ කියපු දේ හරියි කියලා ඉස්මතු කර-කර ඔබතුමාට එගෝල්ලොත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න බැරි නම් කාව හරි යොදවල මේ වැඩේ කරමු කියලා කියන කොට මම ඒකටත් ඇහුම්කන් දුන්නා. අද අනවශ්‍ය තීරණ වලට ශක්තියක් දෙන්න ගිහිල්ලා අද මේ වෙනකොට අඩු වශයෙන් එන්නත් ලබා දෙන තැනට ශබ්ද විකාශන යන්ත්‍රයකින් මේන්න මේ වසමට තමයි එන්නත් දෙන්නේ කියලා කියා ගන්න වත් අපිව දැනුවත් නොකරන තරමට සෞඛ්‍ය

වෛද්‍ය නිලධාරි කාර්යාල දෙක නන්නත්තාර වෙලා. එම නිසා මේ වෙලාවේදි සභාවේදි සමන්ලාල්ට කියන නගරාධිපතිවරයාට ඕන තරම් ගහන්න. හැබැයි මේ සභාවෙන් සමන්ලාල් කියන නගරාධිපතිවරයා මේ පරිපාලනය වන මන්ත්‍රිවරුන්ගෙන් කරගන්න දෙයක් තියෙනවා නම් ඒක ඉස්මතු කරන්න ඕනෑම පුද්ගලයෙක් ඉදිරියේ. ඒකට අඩුවැඩි කරන්න යන්න එපා. ඔහුත් එක්ක තියෙන තරහට. ඒ පාපය තියෙනවා. නැතුව නොවෙයි එකින් එක මට කියන්න ඕන නැහැ. මගේ තියෙන වැරදි නිශාන්ත මන්ත්‍රීතුමා ඕන තැනක,ඕනෑම වෙලාවක ඒ විවේචනයට ගෞරවාන්විත විදියට මගේ ලෙන්ගතු වෙච්ච බැඳීම තියෙනවා. ඒක මම කවදාවත් එතුමා කරනා විවේචනයට මගේ තියෙන්නේ තරහක් නොවෙයි.ඒ විවේචනය සාධාරණයි. හැබැයි සමහර තැනකට ගිහිල්ලා නගරාධිපතිවරයාගෙන් කෙරෙන්න ඕන දේ ඔබතුමා අනිවාර්යයෙන්ම එතනට යන්න ඕන කියන පනිවිඩය කියනවා නම් මෙච්චර දුර වෙලා නැහැ. එතනට ගිහිල්ලා කියන්නේ එයත් එක්ක යන්න ඕන නැහැ ඔබතුමියල කරන දේ හරියි කියන තැනට ගිහිල්ලා ගිය නිසා අද වෛද්‍යවරු මේ මුලු මොරටුවේම සෞඛ්‍යට වග නොකියන ගානටම පත්වෙලා. අද එන්නත් දෙන්නත් වාලේ දෙනවා සමහර වෛද්‍ය වරු තමන්ගේ හිතුමතේට ගහනවා.මේකයි තත්වය. ඒක දෙන්න ඕන දියයුතු කෙනාට, දිය යුතු තැනට. එක පොකුරක් ගිණි නිවිමේ එකේ හර්ෂ කියන ළමයගේ ගෙදර අට දෙනෙකුට එක පාර හැදුනා. අද වෙනකම් දෙවන රැල්ල හැදුන තැනට එක එන්නතක් නැහැ. හැබැයි ඒක උරණ වෙන්න අපිට දෙයක් නැහැ. දැන් තියෙන තැනට දෙන්න ඕන. ඒක කියලා ගැටලුවක් අපිට ඇත්තෙත් නැහැ. නමුත් වෛද්‍යවරයාව පෝෂණය කරන වෙලාවට පෝෂණය කරන්න නගරාධිපතිවරයාගේ බලතලත් එක්ක ඒවා අයින් කරන්න ඕන වෙලාවට නගරාධිපතිවරයාට හයිය වෙන්න කථා කරනවා නම් මම හිතනවා ඉතාමත්ම හොඳයි කියලා.

**3(6)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේ වෙනකොට කොවිඩ් මර්ධන එන්නත මොරටුව ප්‍රදේශයේ ජනතාවට දිමෙන් යනවා.මේ දැන් ලුනාව රොහලේ, සොයිසාපුර ප්‍රජාශාලාවේ විදිනවා. එන්නත් විදින ප්‍රදේශ තීරණය කරන්නේ කවුද කියලා මහජන නියෝජිතයෙක් විදියට මම දන්නේ නැහැ.මහජන මුදලින් අපි නඩත්තු වෙනවා.හැබැයි රටේ ප්‍රධාන කරුණු විශේෂයෙන් විශේෂයෙන්ම කොවිඩ් කාලයේදි ඒ පිලිබඳ අවබෝධයක් නැහැ.එක වෙලාවක කියනවා 30 – 60 ත් අතර විදිනවා ඒකත් අපි දන්නේ නැහැ.එම නිසා ගරු නගරාධිපතිතුමනි මේ සම්බන්ධව විධිමත් වැඩ පිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා නැත්නම් අපි හැමෝම අසරණ වෙනවා.

**3(7)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.රවිනාත් ජේ ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ ගරු මන්ත්‍රීතුමා කියපු දේවල් වලට මම 100% ක් එකඟයි. පෙර පාසැල් කරන අයිතිකරුවන් කීප දෙනෙක් මාව හමුවුනා.මේ අයට කියලා තියෙනවා පෙර පාසැල් පටන් ගන්න පුලුවන් කියලා.මේ අය පෙර පාසැල් පටන් ගන්නවා නම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඒ අංශය භාරඅයගෙන් අවසර ගන්න කියලා.ඒ අය ගියාම අයදුම්පත් දිලා තියෙනවා සම්පූර්ණ කරලා පිටපත් තුනක් අරගෙන 1 එම් ඕ එච් කාර්යාලයට 2, ප්‍රධාන සෞඛ්‍ය පරික්ෂකට 3, එකක් පෙර පාසැලේ තියාගන්න කියලා. ප්‍රධාන මහජන සෞඛ්‍යක ට මේක භාර දිලා ඇහුවා මේකට ලිඛිත අවසරයක් දෙනවද කියලා. මෙහෙම ලිඛිත අවසරයක් නැහැ.චක්‍රලේඛණයක් තියෙනවා ඒ අනුව තමයි කටයුතු කරන්න ඕන කියලා හොඳින් තේරුම් කරලා දුන්නා. ඒක අරගෙන එම්ඕ.එච් කාර්යාලයට ගියාම ඇහුවා මේකට අනුමැතියක් දෙනවද කියලා එතකොට කිව්වා මේ වගේ අයදුම්පත් කිපයක් අපිට ලැබිලා තියෙනවා ඔයගොල්ලන්ට අවශ්‍ය නම් කරන්න අපට අවසර දෙන්න බැහැ කියලා.මමත් ඒ අය සමඟ ගියා. ගුරුවරුන් කිව්වා මෙහෙම ප්‍රශ්ණයක් තියෙනවා ලිඛිත අවසරයක් දෙන්න බැහැ ඔය කවුරු හරි කිව්ව පලියට කරන්නත් බැහැ අපි ළඟ තියා ගන්නම් ඔයගොල්ලෝ පටන් ගන්න කියලා.මම ඇහුවා මේකට වගකීම ගන්නේ කවුද කියලා. ඒක ඔබතුමන්ලා බලා ගනන ඕන කිව්වා. පසුව ළමයි සීමිත ප්‍රමාණ ඉන්න ගුරුවරුන් මේවා පටන් ගන්න හදන්න පටන් ගන්නකොට කොට මේක දැන ගෙන පොල්හේන් ගොඩ

තිබෙන පෙර පාසැල් භාර ස්ථානයෙන් දුරකථනනේ අහනවා පාසැල් අරින්නේ කාගේ අවසරයක් ඇතිවද කියලා.මේ අය කියලා තියෙනවා අපිට මෙහෙම කිව්වා කියලා.මේ පාසැල් අරින්න තහනම්. පාසැල් ඇරලා ප්‍රශ්ණයක් ඇතිවුනොත් වගකිම සම්පූර්ණයෙන් ඔයගොල්ලො භාරගන්න ඕන කියලා.එතකොට මේ ගුරුවරු කිව්වා මොරටුවේ තවත් පෙර පාසැල් කීපයක් මොරටුවේ විවෘත කරලා ඒවා විවෘත කරලා තියෙනකොට අනිත් පෙර පාසැල් වැඩ කෙරුවේ නැත්නම් ළමයි නැති වෙන්න පුලුවන් දෙමාපියන්ගෙන් ප්‍රශ්න ඇති වෙනවා එම නිසා මේකට කරන්න පුලුවන් මොකක්ද කියලා. ඒ අය කියනවලු මේ සම්බන්ධව ක්‍රියා කරන අය ක්‍රියාත්මක වෙන්න ඕන ඒ පෙර පාසැල් විවෘත කරන එක නීති විරෝධියි ඔයගොල්ලෝ පාසැල් පවත්වන්න එපා කියලා.ගරු නගරාධිපතිතුමනි මේක විශාල ප්‍රශ්ණයක්. එක පෙර පාසැලක් පවත්වන්න හිටියේ හෙට වාසනාවකට අද පොල්හේන්ගොඩින් කිව්වා අරින්න එපා කියලා. එදා හවසම පහු වෙනිදාව එන්න හිටපු ලමයි 7 දෙනෙක්ම එක මව දුරකථනයෙන් දැනුම් දෙනවා මගේ මහත්මයාට කොවිඩ් පොසිටිව් අපි සියලු දෙනාම නිරෝධානය කරලා කියලා. හදිස්සියෙන්වත් මේ ළමයි පාසැල් ආවානම් ගුරුවරු පැමිණි ළමයි දෙමාපියන් ඒ සියලු දෙනාම නිරෝධානයට ලක් වෙනවා. මෙය ඉදිරිපත් කලේ ගරු නගරාධිපතිතුමනි මම දන්නේ නැහැ සෞඛ්‍ය පැත්තෙන් ගන්න ඕන ක්‍රියාමාර්ගය කියලා.මේක විශාල ප්‍රශ්ණයක්. මොකක් හෝ තින්දුවක් අපි ඔබතුමාව ශක්තිමත් කරලා හෙට මේ කොවිඩ් කමිටුවේදි තීන්දුවක් ඔබතුමා මහජන සෞඛ්‍ය පරික්ෂක මහතුන් සමඟ එකතු වෙලා පෙර පාසැල් හා පාසැල් සම්බන්ධව ගතයුතු ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. නැත්නම් විශාල විනාශයක් වෙනවා. අනිත් එක් ඉංජෙක්ෂන් සම්බන්ධව දැන් කථා කරන්නේ නැහැ හෙට කථා කරන්නම්.

**04.** <u>**ප්‍රශ්ණ**</u> - නැත

**05.** <u>**යෝජනා -**</u>

**05(1)** මහ නගර සභා මන්ත්‍රී පී.ගාවින් මත්තෙස් මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

" මොරටුව රාවතාවත්ත වාල්ස් පෙදෙස වරිපනම් අංක 53 A හා 49/1 දරණ නිවාස දෙක අතරින් පටන් ගෙන වරිපනම් අංක 51/6 අවසන් වන මාර්ගය මොරටුව හා රාවතාවත්තට ඇති මහත් සාසනික හා ආගමික සමාජය වශයෙන් මහඟු සේවාවක් ඉයුකළ එම්.වී.ඒ. පෙරේරා මහතා සිදු කලාවු සේවයට ගරුකිරිමක් වශයෙන් ඔහු පදිංචිව සිටි ඉහත මාවත එම්.වී.ඒ. පෙරේරා වාවත යනුවෙන්නම් යුතු යැයි ගරු සභාවට යෝජනා කරන්නීය ."

එම යෝජනාව මහ නගර සභා මන්ත්‍රී සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, අංක 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

5(2) අංක 05(02) දරන යෝජනාව සභාවට ඉදිරිපත් නොවිය.

## 06. 2021 පෙබරවාරි මස ස්ථාවර කමිටු වාර්තා සළකා බැලීම.

**06(1) 2021.02.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කමිටු තීරණ සලකා බැලිම.**

**2021.02.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒක මතිකව සහා සම්මත විය.**

**06 (2) 2021.02.09 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලිම.**

මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි,මෝදර ජයගත් පුර හිටපු උපනගරාධිපතිතුමාගේ ඉඩමක් හරහා පාරක් යෝජනා කරල ඉදිරියට ගියා අවසානය මොකද වුනේ කියලා අවබෝධයක් නැහැ කමිටුවෙන් ඉවත් කරලා ප්‍රශ්ණය තවම එසේම තියෙනවා.

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිතුමා,ලබන කමිටුවේදි අනිවාර්්යයෙන්ම සාකච්ජාවට ගන්නවා එතුමාවත් අපි ගෙන්වනවා දිනයත් අරගෙන තියෙන්නේ.

**2021.02.09 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06 (3) 2021.02.09 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලිම.**

මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේශ් ඉන්දික මහතා

ගරු නගරාධිපතිතුමනි,කමිටුවේ අංක 7 වන කරුන සභාවේ අනු කමිටුවක් පත් කිරිමට කමිටුව තීරණයක් ගත්තා ඒ තමයි ගරු ලිහිනි ප්‍රනාන්දු මන්ත්‍රිතුමිය ඉදිරිපත් කරලා තියෙන කාන්තාවන් බල ගැන්විම සහ ඒ සඳහා අවශ්‍ය කරන අනුකමිටුවක් පත් කිරිම පිලිබඳව.

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි,2021.02.09 කමිටුව අංක 07 සඳහා අනුකමිටුව ලෙස මහජන උපයෝගිතාව කමිටුවේ සියලුම සාමාජිකයින්,මහ නගර සභා මන්ත්‍රිවරු හා අනෙකුත් සියලුම ස්ථාවර කමිටු වල සභාපතිවරු හා ඊට අමතරව ඒ කමිටු නියෝජනය නොකරන දේශාලන පක්ෂ නියෝජිත මහනගර සභා මන්ත්‍රිවරුගෙන් සමන්විත අනු කමිටුවක් පත් කරනාවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අංක 2(1) කරුණ ඉදිරිපත් කරන්නේ 2018 දැන් ඒ තත්වය වෙනස් වෙලා තරුණ පිරිස ක්‍රීඩා කරගෙන යනවා අනවශ්‍ය ගැටලුවක් මතුවෙයි කියලා හිතෙන නිසාත්, යෝජනාව ප්‍රායෝගිකව නොගලපෙන නිසා ඉල්ලා අස්කර ගන්නවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අවසාන වශයෙන් දීපු පිලිතුරම තමයි අපිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එවලා තියෙන්නේ තරුණයන්ට ක්‍රීඩා කරන්න පුලුවන් වන මට්ටමට ගිහිල්ලා ළමා උද්‍යානයක් හැදුවට කමක් නැහැ කියලා. එතන දෙකක් කරන්න පුලුවන් කමක් නැහැ. තරුණයන්ට ක්‍රීඩා කරන්න වොලිබෝල් ක්‍රීඩාංගනයක් හදන්න පුලුවන් නම් ඒක තවත් ශක්තිමත් වෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,කමිටුවේ 2(5) කරුණ නාම පුවරුව සම්බන්ධව ගිය කමිටුවට තාක්ෂණ නිලධාරි වාර්තාවක් ආවා බෝඩ් එක ඉදිරිපත් වෙලා නිසා අලුත් බෝඩ් එකක් දානවා කියලා. කමිටුව ඒක නිදේශ කලා.ඒ අවස්ථාවේදි තමයි ඔබතුමා කමිටුවට අවිල්ලා අදහසක් ඉදිරිපත් කරනවා අනුග්‍රාහක ආයතනයක් සොයාගෙන හදන්න කියලා.මම කමිටු සාමාජිකාවක් විදියට කමිටුවේ අදහස නොවෙයි මේ අදහස. එතකොට මේක නිර්දේශයක් විදයට කොහොමද එන්නේ. ඔබතුමාට කොහොමද බලයක් ලැබුනේ මේ කරුනට මේ නිර්දේශය දෙන්න. ගරු නගරාධිපතිතුමනි අපි නගර සභාවට එනකොට දකිනවා බිල්ඩින් හදනවා, පාටිෂන් කරනවා, ඒ සී සවි කරනවා ඔක්කොම කරනවා. නමුත් අපි යෝජනාවක් ගෙනාවට පස්සේ මේක මොරටුව නගර සභාවෙන් පාලනය වන පෙර පාසැලක බෝඩ් එකක් හදන්න කියලා ඒකට මුදල් නැහැ ඒක ගුරුවරියන්ගේ වගකීම ඒහෙම තමයි ඔබතුමා අදහස් දක්වන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය ,නගරාධිපතිවරයා වශයෙන් ඕනෑම කමිටුවකට ගිහිල්ලා මගේ අදහස් ඉදිරිපත් කිරිම කරන්න පුලුවන් එය ඔබටත් දිලා තියෙනවා ඒ අයිතිය ඔබලා නියෝජනය නොකරන කමිටුටකට ඇවිල්ලා දෙන්න පුලුවන් එය ඔබතුමිය අභියෝගයට ලක් කරන්න එපා. ඔබතුමිය කියනවා බෝඩ් එකක්වත් අපි කිව්වම දාන්නේ නැහැ කියලා. එහෙම කියන්න එපා ඔබතුමිය කියපු යෝජනාව අමතරව තමයි මේ වෙනකොට ලක්ෂ 3 ක් මාසෙකට වියදම් කරලා පවත්වාගෙන යන්නේ. ඊට අමතරව තමයි එහා පැත්තේ ඉදිවෙමින් පවතින කසල අංගයේ මේ වෙනකොට ලක්ෂ 5 කට වැඩි ප්‍රමාණයක් මම ගිහිල්ලා මගේ හිතවත් අයගෙන් ගෙනල්ලා තියෙනවා රෝල ඩෝර් එක මම එල්කාඩෝ එකෙන් ගත්තේ නොමිලයේ තීන්ත ඉල්ල ගත්තේ ඒෂියන් පේන්ට් එකෙන් ඒ වෙලාවේ විදුහල්පතිතුමියකුත් කමිටුවේ හිටියා එතකොට කිව්වා ඒ අදාල වෙන්නාවූ ඔතන තියෙන ව්‍යාපාරික ස්ථාන. මම අදහසක් විදියට දැම්මා විතරයි.බෝඩ් එක කරගන්න කියලා.ඔබතුමිය එහෙම කොහමද කියලා මගෙන් අහන්න එපා මම නගරාධිපතිවරයා.මම නගරාධිපතිවරයා විදියට සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව දුන්නා. ඒක ඔබතුතමිය කරුණාකරලා ඉල්ලා අස්කර ගන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කමිටුවට එනකොට මේ කරුණ සාකච්ජා වෙලා තිබුනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, දැනුත් කියනවා බෝඩ් එක ගුරුවරියකට අම්මා කෙනෙක් එක්ක ගිහිල්ලා ඉල්ලන එක විතරයි තියෙන්නේ මොරටුවේ තියෙන මර්මස්ථාන ව්‍යාපාර තියෙන්නේ බොරුපන. අපිත් ගිහිල්ලා ඉල්ලගෙන තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන්න. දැන් මන්ත්‍රීතුමියගේ පැත්තෙන් මතුකරන අදහස් වල සමහර වචන වල ඔබතුමා එල්ලෙන්නේ.ඔබතුමා දිගින් දිගටම කියනවා කමිටු සාමාජිකයින්ට තමයි කථා කරලා අදාල නිර්දේශ සභාවට එවන්න පුලුවන්. කමිටු සාමාජිකයින් කථා කරලා නිර්දේශයක් දෙනවා ඒ නිර්දේශය ගිය වර එනවා. ඊලඟ කමිටුවේදි ඔබතුමාට වගේම අපටත් කමිටුවට ගිහිල්ලා අදහස් දෙන්න පුලුවන්.දැන් නිර්දේශයක් තියෙනවා ඒ නිර්දේශය මේ ගමන වෙනස් වෙලා එනවා මන්ත්‍රීතුමිය කියන්නේ ඒ වෙනස. කමිටු සාමාජිකයින් කථා කරපු එකක් නොවෙයි ඔබතුමා කරපු අදහස නිර්දේශය ලෙස එනවා.ඔබතුමා කමිටුවකට ප්‍රකාශ කරන හැම ප්‍රකාශයක්ම මින් පසුව නිර්දේශ ලෙස එයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, නැහැ එහෙම වෙන්නේ නැහැ මන්ත්‍රීතුමා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන එකට විරුද්ධ නැහැ. කමිටු සමාජිකයින්ගේ නිර්දේශ වෙනස් කිරිමට ඔබතුමාගේ බලපෑමක් ආවොත් ඒක හොඳ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා, බලපෑමක් නොවෙයි කිව්වේ.මම අනිවාර්‍යයෙන්ම මේක හොයා ගන්න කියලා කියපු දෙයක් නොවෙයි. ඕන තරම් ගුරුවරු කොන්සට් වලට ගිහිල්ලා ව්‍යාපාරිකයින්ගෙන් යම් යම් දේ ඉල්ලගෙන එන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කමිටු නිර්දේශයේ පොඩි අඩුපාඩුවක් තියෙනවා. නිර්දේශ සම්බන්ධව ගැටලුවක් නැහැ. මේ කමිටුවේ ඔබතුමා කියපු අදහසේ අපි හිටියා නමුත් මන්ත්‍රීතුමිය ඒ සම්බන්ධයෙන් විරෝධය දැක්වුවා. මම සඳහන් කරන්න කිව්වා මන්ත්‍රීතුමිගේ විරෝධය නමුත් ඒක මෙතන සටහන් වෙලා නැහැ ඒක තමයි මෙතන තියෙන ප්‍රශ්ණය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඕකට නොවෙයි බෙදිමක් ඉල්ලුවේ නැහැ. ශ්‍රියානි හේමලතා ගරු මන්ත්‍රීතුමිය කිව්වේ කිරි පැකට් සඳහා ගිවිසුමක්. මම කිව්වා කිරිපැකට් සඳහා ගිවිසුමට බෙදිමක් ඉල්ලුවා. මම කිව්වා ඒකට ගිවිසුමක් ඕන නැහැ කියලා. ශ්‍රියානි හේමලතා ගරු මන්ත්‍රීතුමිය එවෙලෙම කිව්වා නීත්‍යානුකුල ටෙන්ඩර් පටිපාටිය කරලා තියෙනවා නම් ගිවිසුම් අවශ්‍ය නැහැ කියලා ඒකට විතරයි ගිවිසුමක් ඔබතුමිය ඉල්ලුවේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණයේදි මගේ අදහස විරුද්ධව ප්‍රකාශ කල අදහස වත් මේකේ සඳහන් වෙලා නැහැ.මේ බෝඩ් එක නගර සභාවෙන් සකස් කරලා හයි කරන්න තමයි මගේ අදහස දිගින් දිගටම මම ප්‍රකාශ කලේ.අපි අදහස් ප්‍රකාශ කිරිමෙන් වැඩක් නැහැ. අනිත් කරුණ ඔබතුමා කියපු ගිවිසුම. ගරු නගරාධිපතිතුමනි මේ ගිවිසම මන්ත්‍රිවරියක් විදියට මම නොවෙයි ගේන්නේ.නිලධාරි තමයි අරගෙන එන්නේ.ඊට පසුව ඔබතුමාගේ බලපෑමට නිලධාරිත් යට වෙනවා ඒ වගේම මන්ත්‍රිවරුත් යටවෙනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, ඔබතුමිය කථා කරනකොට කථා කරන්න ඕන සභාවේ නීතිරීති වලට යටත්ව.ඔබතුමිය අනවශ්‍ය විදියට මේ බලපෑම බලපෑම ගැන කියන්න යන්න එපා. මේ ගිවිසුම් ගිවිසුම් කියලා ඕන නැති විදියට ගිවිසුම් එන්නේ නැහැ සභාවේ. ඔබතුමිය කියන විදියට හෙට දවසේදී අපි පොත් ටිකක ගන්න ගියත් ගිවිසුමකට යන්න වෙයි. ඔබතුමිය කරන්න කියලා නිලධාරි කරන්න ගිහිල්ලා ඕක වැරදුනොත් එහෙම ඊට පසුව නිශාන්ත මන්ත්‍රිතුමා කථා කරලා කියනවා ඔබතුමා දැනගන්න ඕන පරිපාලන ප්‍රධානියා විදියට ඇයි වුනේ. එහෙම කථා කරන්න එන්න එපා වැරදි දෙයක් නම් මට අයිතියක් තියෙනවා එතනට ගිහිල්ලා කියන්න. අයිතියක් නැත්නම් නගරාධිපති වෙන්න බැහැනේ. ඔබතුමිය විවේචනය කරන ස්වරූපයයි, ක්‍රමවේදය වෙනස් කර ගන්න.බලපෑමක් නොවෙයි කලේ අනවශ්‍ය දෙයක් එකතු කරන්න ගියාම ඒක වෙනස් කරන්න කිව්වා.ඒක මම කරන්න ඕන.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මගේ විවේචනය කිරිමේ ස්වභාවය මොකද මගේ ස්වභාවය මෙහෙම කියන්න කැමතියි. ඊලඟ කාරණය ගරු නගරාධිපතිතුමනි අංක 2(4) කාරණය ගැන අදහසක් ප්‍රකාශ කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, ඔබතුමියලා කමිටුවලට එනනේ නැතිව මින් පසුව කවුරු හරි එක්කෙනෙක් සඳහා පොඩි කාලයක් දෙන්නම්. කමිටුවට අදහස් ප්‍රකාශ කරන්න එන්නේ නැතුව මින් පසුව නම් කාලය දෙන්න බැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,මම කමිටුවට එන්නේ නැතුව හිටියේ නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය,හරි කමිටුවේදි ඔබතුමිය කිව්වා නම් ඒවා රෙකෝඩ් වෙලා නැත්නත් මෙහෙම වුනේ නැහැ කියලා කියන්න පුලුවන්.ඊට පස්සේ ඔබතුමිය අදට කථා කරන්න ඒ පිලිබඳව දිගින් දිගටම කථා කරන්න දෙන්න අපිට බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මම කමිටුව නියෝජනය කලා මට කියන්න තියෙන්නේ ඇත්තටතම කමිටුවට ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධනේ ස්ථානීය පරික්ෂණය කරන්න ගියාම දැක්ක දේවල් ටික පිංතූර විදියට අපිට එවලා තියෙනවා. ඉතාම හොඳ ගොඩනැගිලි දෙකක් නිල නිවාසවිදියට ඒ නිවාස වෙල මේ වෙනකොට වහල කඩාගෙන වැටිලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,මේ සභාව කමිටුව කර ගන්න එපා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපිට කියලා තියෙනවා කමිටුව මෙතන කථා කරන්න එපා කියලා අපිටත් අවස්ථාව දෙන්න අපි නිහඩ වෙලා ඉන්නවා තීරණයක් තියෙන නිසා.

**2021.02.09 දින පැවති මහජන උපයෝගීතාව,කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(4) 2021.02.10 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

**2021.02.10 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06 (5) 2021.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

**2021.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(6) 2021.02.11 දින පැවැති කර්මාන්ත හා ඉදිකිරීම් පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

**2021.02.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(7) 2021.02.11 දින ව්‍යාපෘති සහ භෞතික සම්පත් කළමනාකරණය පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

**2021.02.11 දින පැවති ව්‍යාපෘති සහ භෞතික සම්පත් කළමනාකරණය පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(8) 2021.02.12 දින පැවැති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

**2021.02.12 දින පැවැති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ ඒකමතිකව සහා සම්මත විය.**

**06(9) 2021.02.12 දින පැවැති මුදල් පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.**

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තමුන්නාන්සේලාගේ බලහත්කාරකම මත කමිටු සම්මත කර ගන්න දරන උත්සහාය අපි දැඩිව විවේචනය කරනවා ප්‍රතික්ෂේප කරනවා කිසිදු ගැටලුවක් නැතිව සභාවේ පැය ගානක් අනවශ්‍ය දේවල් කථා කරන මේ සභාව අවශ්‍ය කාරණාවක් ජනතාව වෙනුවෙන් කථා කරන්න දෙන්නේ නැහැ මුදල් කමිටුවේ 9 ට විරෝධය. ඔබගේ ප්‍රතිරූපය ගොඩනගා ගැනිම වෙනුවෙන් ඔබ ඉදිරිපත් කරන 15 වසරක ලස්සන හෙට ඉදිරිපත් කරන වැඩ සටහනට කැමතියි. ඒ වැඩසටහනට අනුව නොවෙයි මේ ඇස්තමේන්තුව මුල්ගල තියෙන අවස්ථාවට ලක්ෂයයි. වේදිකාවට ලක්ෂ දෙකයි. මඩු කූඩාරම් වලට ලක්ෂ දෙකයි.

\- සභා සෝෂා -

2021.02.12 දින මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම  කමිටු තීරණ වලට පහත නම සඳහන් මන්ත්‍රීවරුන් පක්ෂව ජන්දය ප්‍රකාශ කරනලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්ඳු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |

2021.02.12 දිනැති මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ  අංක 9(1) හා අංක 13(1) විරුද්ධවත් අංක 18, අංක 28, අංක 32, අංක 35, අංක 49, අංක 53 යන තීරණ වලට පක්ෂව හෝ විරුද්ධව ජන්දය ප්‍රකාශ නොකල අතර, මෙම අයිතමයන් හැර අනිකුත් සියලුම තීරණ වලට පක්ෂව පහත නම සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරනලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රි | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රි | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රි | - | යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රි | - | රවිනාත් ජේ. ගුණසේකර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රි | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය |
| 06. | මහා නගර සභා මන්ත්‍රි | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

2021.02.12 දිනැති මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ අංක 09 කරුණට විරුද්ධවත් අනිකුත් සියලුම කමිටු තීරණ වලට පක්ෂවත් පහත නම සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
03. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

2021.02.12 දින මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණ වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මේ අවස්ථාවේදි මහ නගර සභා මන්ත්‍රි යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා, එම්. තිසර රසාංජන මෙන්ඩිස්,එම්.ලිහිනි ප්‍රනාන්දු, බී.සජිත් දුමින්ද පීරිස්, ජී.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු, ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු,එම්.සුදර්ශනි ප්‍රියන්තිකා ප්‍රනාන්දු ,එම්.ශිරෝමි ඉන්දිකා කුරේ, ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු සහ ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු යන මහත්ම/මහත්මීන් සභා ගැබෙහි නොසිටියහ.)

07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව - නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2021.02.12 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 ජනවාරි මාසයන් වලට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

08. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත

09. <u>වෙනත් කරුණු</u> - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලෝ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.03.04 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.